| 6 | අ/අඳ බිහිරි විශේෂ පාසල, අනුරාධපුරය | විජේසේකර මුදියන්සේලාගේ දිසානායක මයා | 2011.06.09 | උතුරු මැද | අනුරාධපුරය | ශ්‍රවණ ඌනතා හා දෘෂ්ටි ඌනතා සහිත ළමයින් |
| 7 | හො/සුබිත විශේෂ පාසල, හොරණ | සේපාල මාර්ටින් පෙරේරා මයා | 2011.07.31 | බස්නාහිර | කළුතර | බුද්ධිමය ඌනතා සහිත ළමයින් |
| 8 | පෙරදිග ලංකා ඉස්ලාමීය ආබාධිතවූවන්ගේ සුභසාධක සංගමයේ බිහිරි පාසැල, කාත්තන්කුඩිය | හසන් ආලිම් මොහොමඩ් ඉස්මායිල් මයා | 2012.02.06 | නැගෙනහිර | මඩකලපුව | ශ්‍රවණ ඌනතා හා බුද්ධිමය ඌනතා සහිත ළමයින් |
| 9 | ගා/නෙත් සවන් සරණ විශේෂ පාසල, පංචාලිය, දික්කුඹුර | පෙරමුණු කංකානම්ගේ ජයසිංහ මයා | 2012.03.05 | දකුණ | ගාල්ල | දෘෂ්ටි ඌනතා, ශ්‍රවණ, ඌනතා, හා බුද්ධිමය |

| අනු. අංකය | උපකෘත විශේෂ පාසලේ නම | යෝජිත නව පාසල් කළමනාකරුගේ නම | පත් කිරීමට යෝජිත දිනය | පළාත | දිස්ත්‍රික්කය | අනුමත ශිෂ්‍ය ස්වභාවය |
|---|---|---|---|---|---|---|
| 10 | මා/රත් කොස්වාන සහන විශේෂ පාසල | ලීලාරත්න ජයසුන්දර මයා | 2012.12.06 | මධ්‍යම | මාතලේ | ඌනතා සහිත ළමයින් ශ්‍රවණ ඌනතා සහිත ළමයින් |

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2012 ක් වූ ඔක්තෝබර් මස 22 වැනි දින,
නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය" බත්තරමුල්ල.

11-965

---

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත අඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2012 නොවැම්බර් මස 09 වැනි දින,
අංක 80, සාංචිආරච්චිගෙ වත්ත,
අධිකරණ මාවත,
කොළඹ 12,
ණය සහනාදයක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (01) 41672 | රාජපක්ෂ පතිරැන්නැහැලාගේ සුනිල් දයාරත්න මයා, ලියනගේ ස්ටෝර්ස්, බෝතලේගම, ලුණුවිල | (1) බ්‍රයන් ක්‍රිස්ටි මැක්ස්වල ප්‍රනාන්දු මයා, අංක 325ඒ, නැ/නයිනමඩම නයිනමඩම<br>(2) රාජපක්ෂ පතිරැන්නැහැලාගේ නිමල් රාජපක්ෂ මයා, දංවෙල පාර, හාල්දඬුවන, දංකොටුව<br>(3) හෙට්ටිආරච්චිගේ දොන් නිලූකා ප්‍රියදර්ශනී මිය, පංසල් හන්දිය, කිරිමැටියාන, ලුණුවිල |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| | | (4) රාජපක්ෂ මුදියන්සේලාගේ ජානක දිනෙස් රාජපක්ෂ මයා, අංක 58/2, අක්කර 80, කිරිමැටියාන, ලුණුවිල පාර-බටහිර |
| (02) 42141 | රාජපක්ෂ පතිරගේ දොන් සෙල්වින් නිවෝන්ඩ් මයා, අංක 315/2, පරණ නුවර පාර, දළුගම, කැළණිය | පිච්චන්දලාගේ චන්න මධුසංඛ මයා, අංක 02, වැල්ලකනත්ත, කළුඑළිය, ජාඇල |
| (03) 42328 | කොම්පඤ්ඤගේ සුදත් විජේලාල් ෆොන්සේකා මයා, අංක 238/14ඒ, රත්න මාවත, දූලම්මහර, බෝකුන්දර, පිළියන්දල | හේවා පේඩිගේ නිරංජලා ශ්‍යාමලී ජයකොඩි මිය අංක 117/23, කටුවාවල පටුමග, ගොඩිගමුව, මහරගම |
| (04) 42343 | හතුරුසිංහ මුදියන්සේලාගේ චාන්දනී රුචිකා හතුරුසිංහ මිය, අංක 531, බෝහින්ගමුව, කුලියාපිටිය | දිසානායක මුදියන්සේලාගේ කමලාවතී මිය, ගලකුඹුර කිතලව |
| (05) 42371 | නිලීපා ජානකී ඒකනායක මිය, "වාසනා", පහලහේන, කඹුරුගොඩ, බණ්ඩාරගම | ගල්හේනගේ දොන් සුධිර සිරිවර්ධන මයා, අංක 341, "සධානා", එලවැල්ල පාර, බැල්ලපිටිය, හොරණ |
| (06) 42386 | කිරිඇල්දෙනියගේ මියුරින් හෙවත් කිරිඇල්දෙනියගේ මියුරින් විනිෆ්‍රිඩා මිය, අංක 470/ඒ, ගනේ පාර, රාගම | බුත්පිටිය ලේකම්ලාගේ ලලිත් බුත්පිටිය මයා, අංක 23, හේකිත්ත පාර, හැඳල, වත්තල |
| (07) 42397 | දොන් නිහාල් වන්නිආරච්චි මයා, අංක 7/23, නීලම්මහර පාර, ගොඩිගමුව, මහරගම | වානගුරුගේ දොන් ඉන්දික සරත් කුමාර මයා, අංක 3/1, හෝකන්දර දකුණ, හෝකන්දර |
| (08) 42403 | බස්නාගලගේ දෝන පුෂ්ප කාන්ති මිය, අංක 435/ඩී, වැලිවිට, කඩුවෙල | සීමාසහිත ගැමුණුපුර සර්වෝදය ග්‍රමදාන සමිතිය, අංක 101/ඒ/5/4, කොතලාවල, කඩුවෙල |
| (09) 42405 | හබරාදූව පීල්ලගේ අනුර ප්‍රියන්ත චාල්ස් මයා, "ප්‍රිය", ඉමදූව පාර, යක්කලමුල්ල | උඩුමලගමගේ චන්ද්‍රසිරි ඩයස් මයා, ගුණවර්ධන මාවත, යක්කලමුල්ල |
| (10) 42414 | යහල බැදිගේ ගුණදාස මයා, අලුදෙනිය, හුණුවල, ඕපනායක | විජේසේකර ආරච්චිලාගේ සෝමාවතී මැණිකේ මිය, උඩවෙල, ඕපනායක |
| (11) 42428 | කළුතන්ත්‍රිගේ දෝන පුෂ්පා ප්‍රියදර්ශනී මිය, අංක 142/1ඒ, හේවාගම, කඩුවෙල | දෝන ඉරුකා සංජීවනී හතරසිංහ මිය, අංක 48/1, රෝහල පාර, නව නගරය, මුල්ලේරියාව |

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## යාපනය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

2009 වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

| **මෙහෙයුම් ආදායම්** | සටහන | *2009.12.31න් අවසන් වූ වසර රු.* | *2008.12.31න් අවසන් වූ වසර රු.* |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රතිපාදන | 4 | 649,600,000.00 | 601,700,000.00 |
| වෙනත් කටයුතු වලින් ශුද්ධ ආදායම්/අහිමිවීම් | 5 | 11,578,911.44 | 8,077,661.74 |
| වෙනත් ලැබීම් | 6 | 12,232,537.21 | 12,297,584.50 |
| | | 673,411,448.65 | 622,075,246.24 |
| ශිෂ්‍යයන් වෙත මූල්‍ය සහයන් | 7 | 62,945,050.00 | 59,646,300.00 |
| | 8 | 736,356,498.65 | 681,721,546.24 |
| **මෙහෙයුම් පිරිවැය** | | | |
| පුද්ගල වැටුප් | | 507,592,088.19 | 450,366,271.30 |
| ගමන් වියදම් | | 5,376,087.96 | 3,824,041.84 |
| සැපයුම් සහ පාරිභෝජනමය භාවිතය | | 23,472,187.66 | 18,177,830.58 |
| නඩත්තු | | 8,344,481.42 | 6,151,203.09 |
| ගිවිසුම් ප්‍රකාර සේවා | | 40,531,477.36 | 38,119,366.01 |
| පර්යේෂණ සහ සංවර්ධන | | 167,650.10 | 351,178.75 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය පිරිවැය | | 101,953,469.37 | 117,602,597.11 |
| වෙනත් මෙහෙයුම් පිරිවැය | | 22,774,283.33 | 11,838,824.05 |
| සමස්ථ මෙහෙයුම් පිරිවැය | | 710,211,725.39 | 646,431,312.73 |
| මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/(හිඟය) | | 26,144,773.26 | 35,290,233.51 |
| ශිෂ්‍යයන් වෙත මූල්‍ය සහයන් | 9 | 62,945,050.00 | 59,646,300.00 |
| සමස්ත කටයුතුවලින් අතිරික්තය (හිඟය) | | (36,800,276.74) | (24,356,066.49) |
| අසාමාන්‍ය අයිතමයන් (අත්හැර දැමීම් සහ වෙනත් ගැළපුම්) | | 348,369.65 | 461,240.14 |
| කාලවකවානුවෙහි ශුද්ධ අතිරික්තය/(හිඟය) පොදු සංචිතයට මාරු කළ | | (37,148,646.39) | (24,817,306.63) |

නිවැරදි බවට සහතික කළෙමු.

මහාචාර්ය එන්. ෂන්මුගලිංගම්,
ගිණුම්කරණ නිලධාරී.

කේ. කනගරත්නම්,
මූල්‍යාධිකාරී.

## යාපනය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

2009 වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | *2009 දෙසැම්බර් 31 රු.* | *රු.* | *2008 දෙසැම්බර් 31 රු.* | *රු.* |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ සහ යන්ත්‍රෝපකරණ | 10 | 716,419,003.84 | | 621,748,128.80 | |
| ආයෝජන (එල්. ටී.) | 11 | 171,558,664.80 | | 160,392,862.92 | |
| ප්‍රගතියක් දක්වන ප්‍රාග්ධන කටයුතු | 12 | 203,667,546.53 | 1,091,645,215.17 | 203,989,221.53 | 986,130,213.25 |
| **ජංගම වත්කම්** | | | | | |
| භාණ්ඩ ලේඛණ/තොග | 13 | 13,454,948.95 | | 10,824,104.64 | |
| වෙළෙඳ සහ වෙනත් ලැබීම් | 14 | 313,394,117.44 | | 370,867,408.96 | |

| | සටහන | 2009 දෙසැම්බර් 31 | | 2008 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| ආයෝජන (එස්. ටී. ) | 15 | 6,742,196.34 | | 5,978,193.41 | |
| මුදල් සහ මුදල් පර්යාය | 16 | 330,001,393.15 | 663,592,655.88 | 259,426,463.02 | 647,096,170.03 |
| සමස්ත වත්කම් | | | 1,755,237,871.05 | | 1,633,226,383.28 |
| **වගකීම්** | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| ගෙවිය හැකි | 17 | 23,147,603.05 | | 34,913,519.23 | |
| නිරවද්‍ය වියදම් | 18 | 3,658,849.67 | | 4,129,871.03 | |
| ස්වයං මූල්‍යකරණ පාඨමාලා | 19 | 56,533,031.64 | 83,339,484.36 | 43,237,497.04 | 82,280,887.30 |
| ජංගම නොවන වගකීම් | | | | | |
| ගෙවිය හැකි | 20 | 4,307,936.40 | | 3,754,733.90 | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 173,430,880.25 | | 167,338,593.75 | |
| සීමා කළ අරමුදල | 21 | 204,716,062.71 | 382,454,879.36 | 191,646,270.87 | 362,739,598.52 |
| සමස්ත වගකීම් | | | 465,794,363.72 | | 445,020,485.82 |
| සමස්ත ශුද්ධ වත්කම් | | | 1,289,443,507.33 | | 1,188,205,897.46 |
| ශුද්ධ වත්කම්/සම කොටස් | | | | | |
| රැස්කර ගත් අරමුදල (ප්‍රාග්ධන ප්‍රතිපාදන) | 22 | 1,968,581,754.50 | | 1,840,002,849.00 | |
| සංචිත | | | | | |
| පොදු සංචිත | 23 | (822,459,627.30) | | (775,796,359.52) | |
| බැඳුම්කර සංචිත | 24 | 143,263,520.13 | | 123,941,547.98 | |
| ප්‍රාග්ධන සංචිත | | 57,860.00 | 1,289,443,507.33 | 57,860.00 | 1,188,205,897.46 |
| සමස්ත ශුද්ධ වත්කම්/සම කොටස් | | | 1,289,443,507.33 | | 1,188,205,897.46 |
| සමස්ත වගකීම් | | | 465,794,363.72 | | 445,020,485.82 |
| සමස්ත වගකීම් සහ සම කොටස් (සේවයේ යෙදවූ සමස්ත අරමුදල්) | | | 1,755,237,871.05 | | 1,633,226,383.28 |

නිවැරදි බවට සහතික කළෙමු.

කේ. කනගරත්නම්,
මූල්‍යාධිකාරී.

මහාචාර්ය එන්. ෂන්මුගලිංගම්,
ගිණුම්කරණ නිලධාරී,
උප කුලපති.

උප කුලපති,
යාපනය විශ්ව විද්‍යාලය.

**යාපනය විශ්වවිද්‍යාලයේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

යාපනය විශ්වවිද්‍යාලයේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා වෙත 2010 ජූලි 23 වැනි දින ඉදිරිපත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචන සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම් සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1. *මතය*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, යාපනය විශ්ව විද්‍යාලය 2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2. 2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.2.1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව සම්පූර්ණයෙන් ම ක්ෂය කරන ලද වත්කම් වෙනුවෙන් ක්ෂය කිරීම වැළැක්වීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ වෙනුවෙන් ක්ෂය කිරීම වෙන් වෙන් ව ගණනය කළ යුතු වුව ද විශ්වවිද්‍යාලය විසින් එයට පටහැනිව වත්කම්වල මුළු වටිනාකම මත ක්ෂය කිරීම් කර තිබුණි. එම නිසා ගිණුම්වල දක්වා තිබුණු රු. 101,953.469 ක් වූ ක්ෂය කිරීම් එක් එක් වත්කම් සඳහා නිවැරදිව හෙළිදරව් කර තිබුණේ ද යන්න තහවුරු කළ නොහැකි විය.

(ආ) 1995 ඔක්තෝබර් මස 05 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුව ඉඩමේ වටිනාකම සඳහා ක්ෂය ගණනය නොකළ යුතු ය. කෙසේ වුව ද ඉඩම සහ ගොඩනැගිල්ලේ වටිනාකම වෙන වෙන ම හඳුනාගැනීමට නොහැකි වීම මත ඉඩම සඳහා ද 5% ක ක්ෂය කිරීමක් කර තිබුණි.

2.2.2. ගණකාධිකරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 2,191,072ක් වටිනා පොත් හා වාර සඟරා විශ්ව විද්‍යාලයට ලැබී නොතිබුණු නමුත්, රු. 438,214ක් වූ ක්ෂය මෙම වත්කම් විෂයයන් සඳහා ද අයකර තිබුණි.

(ආ) රු. 1,827,934ක් වූ පාරිතෝෂික ගෙවීම්, ගිණුම්වල පාරිතෝෂික ගෙවීම් වෙන් කිරීම් ගිණුමට එරෙහිව අයකර නොතිබුණි.

2.2.3. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) එකතුව රු. 4,718,972ක් වූ සැපයුම් අත්තිකාරම් අවතැන් වූ කාර්ය මණ්ඩලයට වැටුප් අත්තිකාරම්, ගොඩනැගිලි අත්තිකාරම්, විවිධ ණයගැති අත්තිකාරම් සහ කාර්ය මණ්ඩල ණය ශේෂ වර්ෂ 01 සිට 23 දක්වා වූ කාල පරාසයක් තුළ අය කරගෙන නොතිබුණි. එම නිසා මෙම ශේෂයන් අයකර ගැනීම සැක සහිතය.

(ආ) ණය ගැතියන්ගෙන් හා ණය හිමියන්ගෙන් පිළිවෙලින් එකතුව රු. 551,553,205ක් සහ රු. 26,801,425ක් වූ සනාථ කිරීම් ලැබී නොතිබුණි.

(ඇ) එකතුව රු. 1,697,624ක් වූ ණය ගැතියන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 1997 දී අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැඩිපුර ලබාදුන් රු. 37,455ක් වූ පොත් දීමනාව මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු. 1,696,378,718 ක් වූ වත්කම්, ගොඩනැගිලි ඉදිකිරීම් අත්තිකාරම්, බැඳුම්කර වගකීම් සහ වියදම් අවශ්‍ය සාක්ෂි නොමැති වීම හේතුකොට ගෙන විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

2.2.5 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පිළිබඳව මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 හා 155 වගන්ති

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හා 18

(ඇ) මුදල් රෙගුලාසි

අංක 103 (1), 104, 109, 264, 271 (2) (ආ), 396, 569, 570, 571, 688 (2) (ඊ), 702 (3), 756, 835, 845, 846 (3), 1645 සහ 1646.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය.

V පරිච්ඡේදයේ 7 : 6 සිට 7 : 6 : 2 සහ 7 : 8 වගන්ති
XX පරිච්ඡේදයේ 3 : 1 වගන්තිය
XXIV පරිච්ඡේදයේ 3 : 1 වගන්තිය
XXV පරිච්ඡේදයේ 2 : 2 (ඊ) වගන්තිය
XXVI පරිච්ඡේදයේ 2 : 4 හා 5 වගන්තිය
XXVI පරිච්ඡේදයේ 3 : 3 වගන්තිය
XXVII පරිච්ඡේදයේ 9 : 4 වගන්තිය

(ඉ) 1979 ජූලි 29 දිනැති අංක 828 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

(ඊ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 1989 මාර්තු 23 දිනැති අංක 19/89, 1995 මාර්තු 16 දිනැති අංක 11/995 සහ 2004 දෙසැම්බර් මස 27 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ.

(උ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

(i) 1980 පෙබරවාරි 25 දිනැති අංක 63
(ii) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94

(ඌ) 2007 ජනවාරි මස 18 දිනැති අංක 03 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද එකතුකළ අගය මත බදු චක්‍රලේඛය

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය සමාලෝචනය*

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 686,748.646 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 626,517.307ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 649,600,000ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 37,148,646ක් දක්වා අඩු වී තිබුණු අතර, ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 601,700,000ක් වූ රජයේ ප්‍රධාන ගණන් ගැනීමෙන් පසුව එම වර්ෂයේ ඌනතාවය රු. 24,817,307ක් දක්වා අඩු වී තිබුණි.

3.1.2 *නිශ්චිත අරමුදල් උපයෝජනය*

නිශ්චිත අරමුදල් සඳහා ලැබුණු රු. 11,571,939 ක මුදල, ඒවා ප්‍රදානය කරන ලද අරමුණු සඳහා උපයෝජනය කිරීමෙන් තොරව ස්ථාවර තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

3.1.3 *ආර්ථික නොවූ ගණුදෙනු*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ පීඨ හා සේවා අංශ සඳහා සෘජු දුරකථන මාර්ග සියයක් ලබාදී තිබුණු අතර, අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා අභ්‍යන්තර සන්නිවේදන පද්ධතියක් විශ්වවිද්‍යාලය තුළ තිබියදීත් අභ්‍යන්තර දුරකථන පද්ධතිය භාවිතයට ගැනීම වෙනුවට සෘජු දුරකථන මාර්ග වැඩි වශයෙන් යොදා ගෙන තිබුණි. අභ්‍යන්තර දුරකථන පද්ධතිය සම්පූර්ණ ධාරිතාවයෙන් යුතුව භාවිතා කරනු ලැබුවේ නම් ගෙවා තිබුණු රු. 7,132,248ක් වූ මුළු දුරකථන ගාස්තුව රු. 6,800,248ක් දක්වා අඩු කර ගත හැකිව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදී ම උපාධි අධ්‍යයන පීඨයේ සහ බාහිර විභාග ඒකකයේ රු. මිලියන 314 සිට රු. මිලියන 352 දක්වා මුදල් ශේෂයක් පැවති අතර, මෙම මුදල පොළී උපදවන පදනම මත ආයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සැලකිය යුතු මුදල් ආදායමක් විශ්වවිද්‍යාලයට අහිමි වී තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාලයේ අමුත්තන් සඳහා අමුත්තන්ගේ නිවාස පහසුකම් තිබුණු අතර, එම අමුත්තන්ගේ නිවාස සඳහා මුරකරුවෙක් පත්කර සමාලෝචිත වර්ෂය තුළ දී එකතුව රු. 207,150 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණු නමුත් අමුත්තන් සඳහා විවිධ නවාතැන් වෙනුවෙන් නවාතැන් පහසුකම් ගාස්තු (ආහාර සහ නවාතැන්) ලෙස සමාලෝචිත වර්ෂයේ දී රු. 421,548 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) රු. 195,500ක නඩත්තු කිරීමේ කම්කරු ගාස්තු ඇතළත්ව විශ්වවිද්‍යාලයේ නව කලා කේන්ද්‍රය භූමි පරිශ්‍රය මට්ටම් කර ගෙවතු උද්‍යානය පවත්වාගෙන යාම සඳහා රු. 343,645ක මුදල් පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවා තිබුණි. මෙම නඩත්තු කාර්යය විශ්වවිද්‍යාලයේ කම්කරුවන්ගෙන් සිදු කරගත හැකිව තිබුණි.

3. 1. 4 *වත්කම් කළමනාකරණය*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ ः

(අ) ස්කූටර් දෙකක් වර්ෂ අටකට වැඩි කාලයක් භාවිතා නොකර පැවතුණි.

(ආ) කළමනාකරණ පීඨයට ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා රු. 6,589,667ක් වූ පිරිවැයකට මිල දී ගෙන තිබුණු ඉඩමක් වර්ෂ 5 කට වැඩි කාලයක් එම අරමුණ සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) එකතුව රු. 200,305ක් වූ වර්ග 10කට අයත් ඉන්වෙන්ටර් විෂයයන් 5,258ක් වර්ෂ අටකට වැඩි කාලයක් ගබඩාවල නිශ්කාර්යව පැවතුණි.

(ඈ) රු. 1,82,400 කට මිල දී ගත් වේලා සටහන් යන්ත්‍රයක් 2001 වර්ෂයේ සිට භාවිතා නොකර පැවතුණි.

(ඉ) රු. 2,137,500 කට මිල දී ගෙන තිබූ වානේ ඇඳන් 225ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් භාවිතා නොකර පැවතුණි.

3.1.5. *හඳුනාගන්නා ලද පාඩු*

(අ) වටිනාකම රු. 348,370ක් වූ ස්ථාවර වත්කම්, ගබඩා විෂයයන්, සහ පොත් සම්බන්ධයෙන් වූ පාඩු සමාලෝචිත වර්ෂය තුළ ලියා හැර තිබුණි.

(ආ) 2006 සිට 2009 දක්වා කාල පරිච්ඡේදය තුළ ණයවර ලිපි 6ක් අවලංගු කිරීම වෙනුවෙන් රු. 90,062ක් බැංකුවක් විසින් අයකර ගෙන තිබුණි.

3.1.6 *ව්‍යාපෘති ප්‍රමාදයන්*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂය තුල දී විශ්වවිද්‍යාලයේ කාන්තා නේවාසිකාගාර සංකීර්ණය සඳහා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම සඳහා උපදේශක ගාස්තු ලෙස රු. 750,375 ක අත්තිකාරම් මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට ගෙවන ලදී. කෙසේ වුව ද සාමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

(ආ) වෛද්‍ය පීඨයෙහි ශ්‍රවනාගාරයක් ඉදිකිරීම සඳහා 1999 සිට 2000 දක්වා වූ කාලය තුළ ඉදිකිරීම් සමාගමකට රු. 7,611,885ක් ගෙවා තිබුණි. කෙසේ වුව ද ඉදිකිරීම් කටයුතු මෙතෙක් සම්පූර්ණයෙන් නම් කර නොතිබුණි. මෙම අනවශ්‍ය ප්‍රමාදය හේතුකොට ගෙන ඉදිකිරීම් පිරිවැය අති විශාල වශයෙන් වැඩිවීමට ඉඩ ඇති අතර, ඉදිකිරීමේ අරමුණ ද ඉටු වී නොතිබුණි. මීට අතිරේකව අභ්‍යන්තර

නිර්මාණ වැඩ සඳහා 2005 සහ 2006 වර්ෂවල දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. 13,000,000 ක් ගෙවා තිබුණු අතර, ඒවා ද මෙතෙක් ආරම්භ කර හෝ නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම පීඨය සඳහා තොග වශයෙන් විදුලිය සැපයීම සඳහා විදුලිබල මණ්ඩලයට 2005 වර්ෂයේ දී අත්තිකාරම් ලෙස රු. 2,607,050ක් ගෙවා තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිය මේ දක්වා ආරම්භ කර නොතිබුණි.

(ඈ) තිරුනල්වේලි ශිෂ්‍ය නේවාසිකාගාරයට මුදුන් ජලටැංකියක් ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අත්තිකාරම් ලෙස 1989 වර්ෂයේ දී රු. 2,000,000 ක් ගෙවා තිබුණු නමුත්, රු. 1,590,000 ක වටිනාකමකින් යුත් වැඩ කොටස් පමණක් සම්පූර්ණ කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම පීඨයේ ශිෂ්‍යයින් එහි බලපෑමට ලක් වී තිබුණි.

(ඉ) කළමනාකරණ සහ වානිජ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ඉඩමක් මිල දී ගැනීමට 2005 වර්ෂයේදී රු. 6,589,667ක් ගෙවා තිබුණි. එම ව්‍යාපෘතිය මේ දක්වා ආරම්භ කර නොතිබුණි.

(ඊ) කොළඹ පිහිටි සමාගමකට එකතු කළ අගය මත බදු ලෙස රු. 1,323,071ක් සහ සීඩා (SIDA) තොරතුරු තාක්ෂණ ජාල ව්‍යාපෘතියෙන් තවත් රු. 8,820,474ක් එම සමාගමට ගෙවා තිබුණි. එම ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා විගණනයට ලබාගත නොහැකි විය. ව්‍යාපෘතිය 2005 මුල් භාගයේ දී ආරම්භ කර තිබුණ ද, 2010 ජූනි මස 30 වැනි දින විට විටක් එය අවසන් කර නොතිබුණි. මෙහි ප්‍රතිපලයක් ලෙස ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

(උ) පම්පායිමාඩුහි වවුනියාව මණ්ඩලය සඳහා මුදුන් ජල (Overhead tank) ටැංකියක් හා භූගත ජල ටැංකියක් (sump) ඉදිකිරීම සඳහා එවකට උතුරු නැගෙනහිර පළාත් සභාවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයාට 2004 දෙසැම්බර් 31, 2005 නොවැම්බර් 16 හා 2006 නොවැම්බර් 10 යන දිනවලදී පිළිවෙලින් රු. 3,200,000 සහ 3,014,000ක් සහ රු. 5,615,000ක් වශයෙන් අත්තිකාරම් තුනක් මුදාහැර තිබුණි.

භූගත ජල ටැංකිය ඉදි කිරීම් නිම කර තිබුණි. කෙසේ වුවද, මුදුන් ජල ටැංකිය සහ ඉතිරි වැඩ කොටස් නිම කර නොතිබුණි. මේ අතරතුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්තුව නවත්වා දමා තිබුණි. වැඩ නැවැත්වීම දක්වා කොන්ත්‍රාත්කරුට රු. 2,439,956ක් ගෙවා තිබුණි. ඉතිරි වැඩ සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමග රු. 5,615,000 ක වටිනාකමින් යුත් නව ගිවිසුමක් අත්සන් කර තිබුණි. එහෙත් 2010 ජූනි මස 30 දක්වා වැඩ සම්පූර්ණ කර නොතිබුණි.

3.2 *මානව සම්පත් කළමනාකරණය*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාමාන්‍ය රීතියක් ලෙස විශ්ව විද්‍යාලයේ ස්ථිර කථිකාචාර්ය තනතුරු සඳහා එක් එක් පීඨයට වෙන් වෙන් ව බඳවාගෙන තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එකම අධ්‍යයන ක්ෂේත්‍රය වෙනුවෙන් කථිකාචාර්යවරු කිහිප දෙනෙකු යොදවාගෙන තිබුණි. විවිධ පීඨ සඳහා කාල සටහන් සකස් කිරීමේ දී අනෙකුත් පීඨවල සිටින ස්ථිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීම කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබුණි. වෙනත් පීඨයක් සඳහා ස්ථිර කථිකාචාර්යවරයෙකුගේ සේවය අවශ්‍ය විටක දී බාහිර කථිකාචාර්යවරයකු ලෙස වෙනම පත්වීමේ ලිපියක් නිකුත් කර එවැනි සේවා සඳහා අතිරේක දේශන ගාස්තු ගෙවා තිබුණි.

(ආ) නියමිත බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලයෙන් දෙපාර්තමේන්තු අංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම මත බොහෝ අවස්ථාවල දී තාවකාලික කථිකාචාර්යවරුන් උපදේශකයින් (tutors) සහ ප්‍රදර්ශකයින් පත් කර තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාල පද්ධතිය තුළ රැකියා අපේක්ෂා කරන සුදුසුකම් සහිත අයට තරගකාරීව ඉදිරිපත් වීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව අවිධිමත් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම විශ්ව විද්‍යාලයේ සාමාන්‍ය ලක්ෂණයක් විය. ඉකුත් වර්ෂ සඳහා වූ මාගේ වාර්තාවලින් මේ සම්බන්ධයෙන් කරුණු පෙන්වා දී තිබුණු නමුත් මෙම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.3 පාඨමාලා සහ විභාග ඃ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාලයේ පාඨමාලා 10 වෙනුවෙන් ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 4,776ක් විය. සමාලෝචිත වර්ෂය තුළ දී දරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 4,23,716,860ක් විය. එක් ශිෂ්‍යයකු සඳහා සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු. 88,718ක් විය.

(ආ) විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨය යටතේ විවිධ පාඨමාලා සඳහා විභාග පවත්වන දිනයන් හා විභාග ප්‍රතිඵල නිකුත් කරන ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2008 සහ 2009 වර්ෂවල දී පීඨ කිහිපයක පවත්වා තිබුණු විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමට සැහෙන ප්‍රමාදයක් සිදු වී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව විභාගය අවසන් වී මාස තුනක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු ය. එහෙත් මාස 06 සිට 12 දක්වා කාල පරාසයක් ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රමාද වී තිබුණි.

3.4 ***පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා වැටුප් සහිත සහ වැටුප් රහිත නිවාඩු ලබාදීම*** :

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යයන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 27.4 වගන්තියේ උපදෙස් සැලකිල්ලට නොගෙන අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ කථිකාචාර්යවරුන්ට එක් වර්ෂයකට වැඩි කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි.

(ආ) වර්ෂයක සේවා කාලය සම්පූර්ණ වීමට ප්‍රථම පරිවාස කාලයේ සිටින කථිකාචාර්යවරුන්ට ද අධ්‍යයන නිවාඩු අනුමත කළ අවස්ථා නිරීක්ෂණය විය.

3.5 *අයවැය ලේඛණමය පාලනය* :

අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

**4. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු ය.

(අ) මානව සම්පත් කළමණාකරණය
(ආ) අයවැය
(ඇ) ගබඩා
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) පුස්තකාල පරිපාලනය
(ඊ) ස්ථාවර වත්කම්.

එච්. ඒ. එස්. සමරවීර,
*වැඩබලන විගණකාධිපති.*

**යාපනය විශ්ව විද්‍යාලයේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ගිණුම්වලට අදාළ විගණකාධිපති වාර්තාව පිළිබඳව යාපනය විශ්ව විද්‍යාලයේ පාලන අධිකාරියේ නිරීක්ෂණය**

2.2.2 ගණකාධිකරණ අඩුපාඩු:

(අ) එම තත්ත්වය මගහරවාලීමට අප ක්‍රියා කර ඇත.
(ආ) ගිණුම්වල පාරිතෝෂිකය ගෙවීම නිසි පරිදි සිදුකර ඇත.

2.2.3. ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම් :

(අ) (i) *සැපයුම් අත්තිකාරම්* - ශේෂ මුදල සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
(ii) අවතැන් වූ කාර්ය මණ්ඩලය සඳහා රු. 16,760 ක වැටුප් අත්තිකාරම් 2010 වර්ෂයේ දී කපා හැරීම සඳහා කටයුතු කර තිබුණි.
(iv) *ගොඩනැගිලි අත්තිකාරම්* - නොපියවූ අත්තිකාරම් 2010 දී පියවීමට කටයුතු කර තිබුණි.
(v) *කාර්ය මණ්ඩල ණය* - ණයමුදල් ආපසු අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

(ආ) ලැබිය යුතු මුදල්වලින් වැඩි ප්‍රමාණයක් සේවකයන්ට ගෙවන ලද ණය/අත්තිකාරම් ශේෂය මගින් නිරූපණය වන අතර, ශිෂ්‍ය තැන්පතු හා කාර්ය මණ්ඩල ඇප තැන්පතුවලින් ගෙවිය යුතු ගිණුම නිරූපණය වේ. මේ සම්බන්ධයෙන් තහවුරු කිරීම ලබා ගැනීම සැලකිල්ලට ලක් වී නොමැත.

(ඇ) 2009 වර්ෂය සඳශා උපලේඛනයේ සඳහන් කාල විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. කරුණාකර නැවත එය බලන්න. කෙසේ වුවත් පරීක්ෂා කර බැලීමේ පහසුව සඳහා රු. 1,697,624.00 ක මුදල සඳහා වූ කාල විශ්ලේෂණය පහත දක්වා ඇත :-

(i) ගොඩනැගිලි පුනරුත්ථාපනය සඳහා අත්තිකාරම් ගෙවීම්,
වවුනියා විශ්ව විද්‍යාලය රු. 850,000

| *කාල විශ්ලේෂණය* | *මුදල* | *කිවයුතු කරුණ* |
|---|---|---|
| අවු. 8 | 850,000 | 2010 දී පියවා ඇත. |

(ii) මාර්ග සංවර්ධනයට අත්තිකාරම් රු. 842,824

| *කාල විශ්ලේෂණය* | *මුදල රු.* | *කිවයුතු කරුණ* |
|---|---|---|
| අවු. 22<br>අවු. 20<br>අවු. 19<br>අවු. 18<br>අවු. 17<br>අවු. 5 | 170,000<br>62,600<br>1,307<br>138,700<br>6,600<br>463,617<br>842,824 | ව්‍යාපෘති නිරීක්ෂණ කමිටුව, මූල්‍ය කමිටුව සහ පාලන සභාවේ අනුමැතිය ඇතිව මෙම අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස වැඩ ඉංජිනේරුවරයාගෙන් ඉල්ලීමක් කර ඇත. |

(iii) සැපයුම් අත්තිකාරම් (උපකරණ)

| *කාල විශ්ලේෂණය* | *මුදල රු.* | *කිවයුතු කරුණ* |
|---|---|---|
| අවු. 01 | 4,800 | 2010 දී එය පියවා ඇත. |

(ඇ) නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

2.2.4 පහත දැක්වෙන ආකාරයට කටයුතු කර ඇත.

| *බලපෑම් සිදු වී ඇති ගිණුම්වල ඇති අයිතම පිළිබඳ විස්තරය* | *2009 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය රු.* | *ලබාගත නොහැකි සාක්ෂ්‍යය* | *ගෙන ඇති පියවර* |
|---|---|---|---|
| යාපනය විශ්ව විද්‍යාලය | - | තක්සේරුව හා සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (අ) ඉඩම් හා ගොඩනැගිලි | 676,019,806 | තක්සේරුව හා සමීක්ෂණ මණ්ඩල වාර්තා | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ආ) ඉඩම් | 28,994,671 | ස්ථාවර වත්කම් පිළිබඳ වටිනාකම පෙන්වන සත්‍යාපන වාර්තා | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ඇ) කාර්යාලීය ලී බඩු | 616,424,777 | එම | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ඈ) පුස්තකාල පොත් හා සඟරා | 204,969,346 | එම | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ඉ) මෝටර් රථ | 21,475,415 | එම | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ඊ) ලෝගුව | 2,986,215 | එම | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (උ) කම්හල් හා යන්ත්‍රසූත්‍ර | 2,132,537 | එම | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |

| බලපෑම් සිදු වී ඇති ගිණුම්වල ඇති අයිතම පිළිබඳ විස්තරය | 2009 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය රු. | ලබාගත නොහැකි සාක්ෂ්‍යය | ගෙන ඇති පියවර |
|---|---|---|---|
| (ඌ) දුරකථන හුවමාරුව | 3,055,843 | ස්ථිවර වත්කම් පිළිබඳ වටිනාකම පෙන්වන සත්‍යාපන වාර්තාව | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (එ) තැපැල් | 14,145 | සත්‍යාපන වාර්තාව | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ඒ) අත ඇති මුද්දර | 19,671 | එම | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ක) අධ්‍යයනාංශ වල ඇති තොග | 302,462 | එම | සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| (ග) අනෙකුත් පුනරාවර්තතන වියදම් (උපචිත) | 633,008 | විස්තර උපලේඛනය | විස්තර ගොනුවෙන් ලබාගත හැක. |
| (අ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අත්තිකාරම් | | | |
| මාර්ග සංවර්ධනය | 842,824 | ඇස්තමේන්තු, ප්‍රමාණ පිළිබඳ බිල්පත්, ගිවිසුම් මිනුම් ලේඛන, වැඩ අවසන් වීමේ සහතික හා කාර්යාලීය මුදල් ලැබීම් ආදිය | වැඩ ඉංජිනේරු හා එස්. ඒ. ආර්/ප්‍රාග්ධන වැඩ මගින් පවත්වාගෙන ගිය ගොනුවේ විස්තර. |
| ගොඩනැගිලි සඳහා පුනරුත්ථාපන අත්තිකාරම් | 11,236,281 | | |
| ලංකා විදුලි බල මණ්ඩලයට අත්තිකාරම් | 2,607,050 | | |
| හදිසි පුනරුත්ථාපන ගොඩනැගිලි අත්තිකාරම් | 542,563 | | |
| උතුරු නැගෙනහිර පළාත් සභාවට අත්තිකාරම් | 4,854,955 | | |
| කෘෂි විද්‍යා පීඨය පරිගණක ඒකක සඳහා අධ්‍යයනාංශය | 3,150,000 | | |
| (ආ) පුනරුත්ථාපන අත්තිකාරම් වවුනියා මණ්ඩපය | 2,465,875 | | |
| (ඇ) බැඳුම්කර වගකීම් | 107,839,707 | කාල විශ්ලේෂණය | ලබාගත හැක. |
| (ඈ) සැපයුම් අත්තිකාරම් වවුනියා මණ්ඩපය | 1,679,533 | කාල විශ්ලේෂණය | 2009 උපලේඛනයෙන් ලබාගත හැකිය. |
| (ඉ) පරිගණක මිලදී ගැනීම | 3,783,139 | බිල්පත | සැපයුම් ඒකකයෙන් ගොනුව ලබාගත හැකිය. |
| (ඊ) සෝනි ඩිජිටල් කැමරා මිළදී ගැනීම | 337,500 | බිල්පත | සැපයුම් ඒකකයෙන් ගොනුව ලබාගත හැකිය |
| (උ) දුරකථන ගාස්තු සඳහා ඉකුත් වූ ගෙවීම් | 11,463 | මු.රෙ. 115 අනුමැතිය | මූල්‍ය කමිටුවේ හා විශ්ව විද්‍යාල කවුන්සලයේ අනුමැතිය ලැබී ඇත. |
| | 1,696,378,718 | | |

2.2.5. විශ්ව විද්‍යාල පනත, ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන අවස්ථාවලදී එසේ අනුකූල වීම සඳහා පියවර ගෙන ඇත.

3.1.2. පරිත්‍යාගශීලියාගේ නිර්ණායකවලට අනුව අරමුදල් භාවිතා කළ හැකිය.

3.1.3. (අ) "ඉන්ටර්කොම්" පද්ධතිය ඉවත් කිරීමේ අපේක්ෂාවෙන් SIDA මගින් අරමුදල් ලබාදෙන විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන ජාල ගත කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ ද පවතින තත්ත්වය හේතු කොටගෙන එම ජාලය සම්පූර්ණ කිරීමේ දී කොන්ත්‍රාත්කරුවන්ට

නොවැළැක්විය හැකි ප්‍රමාදයක් ඇති වීම හේතුකොට ගෙන "ඉන්ටර්කොම් පද්ධතිය" ඉවත් කිරීම කල් දැමීමට සිදු විය. දැන් නැවතත් එම ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ වී තිබෙන අතර එය සම්පූර්ණ කිරීමට ආසන්නව පවතී. එවිට ටෙලිකොම් ආයතනය මගින් ලබාගන්නා අනවශ්‍ය අයකිරීම් අඩුවනු ඇත.

(ආ) ඇතැම් මුදල් ගෙවිය යුතු අධ්‍යයන පාඨමාලාවල එකතුව හේතුවෙන් මුල්‍ය ශේෂයක් පවතී. මුදල් ගෙවිය යුතු අධ්‍යයන පාඨමාලා නියම කර ඇති කාලයක් තුළ පැවැත්වෙන පාඨමාලා වේ. බැඳුම්කර වගකීම් හා ප්‍රධාන අරමුදල මගින් ලැබී ඇති මුදල් ද ශේෂයේ ඇතුලත් වී ඇති අතර මේවා වරින්වර ස්ථිර තැන්පතුවලටද මාරු කර තිබේ.

(ඇ) විශ්ව විද්‍යාලයේ අමුත්තන්ගේ නිවාසය වායු සමීකරණය හා වෙනත් අවම පහසුකම්වලින් පමණක් සමන්විතය. මහාචාර්යවරු හා වෙනත් නිලධාරීන් වර්තමාන තත්ත්වය මත මෙහි නැවතී සිටීමට කැමති නැත. මෙහි පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගනු ලැබේ.

(ඈ) පසුගිය වසර 25 ක කාලය තුළ අපගේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් මට්ටමින් නුපුහුණු කම්කරුවන්ගේ සංඛ්‍යාව වැඩි වී නැත. එහෙත් ඉඩකඩ හා යටිතල පහසුකම් සිව් ගුණයකට වඩා වඩා වැඩි වී ඇත. තවද, නඩත්තු කිරීමේ ශාඛාවේ ඇබෑර්තුවලින් 1/3ක් පටිපාටිමය බාධක හේතුවෙන් පුරවා නැත. දැනට සිටින කාර්ය මණ්ඩලය වැදගත් මෙන් ම හදිසි කටයුතුවල පමණක් නිරත වන නිසා මෙම කටයුතු බැහැරින් ඉටු කර ගනු ලැබේ.

3.1.4. (අ) ස්කූටර් අළුත්වැඩියා කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

(ආ) මම ව්‍යාපෘතිය සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගැනීම ප්‍රමාද විය. කැබිනට් හා නිර්මාණ ශිල්පී අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ඉදිකිරීම පිළිබඳ 1 වන අදියර සම්පූර්ණ කර ඇත.

(ඇ) වාර්තාවේ දැක්වෙන අයිතම භාවිතා කිරීමට පියවර ගෙන ඇත.

(ඈ) මෙම අයිතමය ක්‍රියාත්මක කිරීමේ දී ඇතැම් අවහිරතා ඇති විය. මේ සම්බන්ධයෙන් දැන් පියවර ගනිමින් සිටියි.

(ඉ) අතිරේක පෞද්ගලික නේවාසිකාගාර ද සමග පිට පළාත්වල ශිෂ්‍යයන්ගේ භාවිතය සඳහා ඇඳන් මිලට ගන්නා ලදී. දැනට මෙම ඇඳන් සිද්ධ වෛද්‍ය නේවාසිකාගාරය නැවත පිහිටුවීම සඳහා මෙන් ම දැනට පවතින නේවාසිකාගාරවල අතිරේක අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා වෙන්කර ඇත.

3.1.6 (අ) නිශා ගංවතුරට මුහුණ දීමට සිදු වීම නිසා සැලසුම නැවත ප්‍රතිශෝධනය කළ යුතු වීම නිසා මෙන් ම මුල්‍ය සීමාකරණය හේතුකොට ගෙන මෙම ප්‍රමාදය සිදු විය. දැනට එය ඉදිරියට කරගෙන යනු ලැබේ.

(ආ) මෙම ප්‍රමාදය ඉතා කණගාටුවෙන් විශ්ව විද්‍යාලය පිළිගනියි. කොළඹ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමග මෙන් ම රටේ වෙනස් වන පරිසරය සමඟ ද නිරන්තර සංවාදයක් සහිතව මෙම කටයුතු සම්පූර්ණ කර ගැනීමට අවධානය යොමු කර ඇත. මෙම කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම සඳහා එහි කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

(ඇ) කිලිනොච්චියේ පිහිටි කෘෂිවිද්‍යා පීඨය නැවත පිහිටුවීමේ බලාපොරොත්තුවෙන් මෙම මුදල් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ තැන්පතු මගින් රඳවාගෙන සිටියෙමු. එසේ වුව ද, දිගින් දිගටම සිදු වූ ප්‍රමාදය හා අරමුදල් සීමාසහිත වීම නිසා 2010 වසරේ තවත් හදිසි ව්‍යාපෘතියක් වන නේවාසිකාගාර (වෛද්‍ය පීඨය) ව්‍යාපෘතියට එම මුදල් මාරු කරනු ලැබී ය.

(ඈ) උතුරේ පැවැති අයහපත් තත්ත්වය හා අරමුදල් හිඟය නිසා මෙය ප්‍රමාද විය හැකි ය. නැවත ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

(ඉ) 3.1.4 (ආ) හි දී ඇති පිළිතුර බලන්න.

(ඊ) SIDA තොරතුරු තාක්ෂණ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශය මගින් තොරතුරු තාක්ෂණ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය භාරගෙන තිබුණි. එහි නියම හා කොන්දේසිවලට අනුව වැට් (VAT) ගෙවීම යාපනය විශ්ව විද්‍යාලය මගින් කළ යුතුව තිබුණි. ඒ අනුව මෙම විශ්ව විද්‍යාලය මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශය මගින් කොන්ත්‍රාත්තුව ලබා දුන් කොන්ත්‍රාත්කරු වන "එන්ටර්ප්‍රයිස් ටෙක්නොලොජි (පුද්.) සමාගම" ට වැට් වශයෙන් රු. 1,323,071.10ක් ගෙවනු ලැබීය. තවද, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශයට යාපනය විශ්ව විද්‍යාලයය මගින් රු. 8,820,474ක් ගෙවා නොමැත. මෙම මුදල කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශය මගින් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. සත්‍යාපනය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශයෙන් ව්‍යාපෘති වාර්තාව ඊගෙන බැලිය හැකි ය.

සත්‍ය වශයෙන් ම අප 3. 3. 3. (අ) හි දක්වා ඇති පිළිතුර පරිදි මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වූයේ පවතින තත්ත්වය හා කොන්ත්‍රාත්කරුවන් නිසා ය. පරිසරයේ වෙනස් වීමත් සමග මෙම ව්‍යාපෘතිය සක්‍රීය වී දැනට අවසන් වීමට ආසන්න ය.

(උ) කොන්ත්‍රාත්කරු විසින් මුහණ දෙන ලද නොවැළැක්විය හැකි හේතු මත කොන්ත්‍රාත්තුව වෙනස් කරනු ලැබී ය. කොන්ත්‍රාත්කරු වෙනස් කිරීමත් සමඟ දැනට වැඩ කටයුතු සිදු වෙමින් පවතී.

3.2 (අ) ස්ථිර කථිකාචාර්ය මණ්ඩලය තම පීඨයේ මෙන් ම වෙනත් පීඨවල අධ්‍යයන කටයුතු ද තම වැටුප හැර වෙනත් පාරිශ්‍රමික කිසිවක් නොමැතිව සිදු කරති. යම් අධ්‍යයන තනතුරකට අනුමත අධ්‍යයන මානයට වඩා යම් කථිකාචාර්යවරයකුගේ ඉගැන්වීමේ වගකීම් භාරය ඉතා අධිකවන විට දේශන සඳහා ඔවුන් බාහිර කථිකාචාර්යවරුන් ලෙස පත්කිරීම මගින් ගෙවීමක් කරනු ලැබේ. තමා අයත් වන පීඨයෙන් පිටත අධ්‍යයනාංශයක් සඳහා ඔවුන්ගේ අධ්‍යයන මානවලට පරිබාහිර දේශන සඳහා ගෙවීමක් ඔවුන් ලබා ගනිති. නොවැළැක්විය හැකි හේතූන් මත මෙවැනි බාහිර පත් කිරීම් ඉතා සුළු ප්‍රමාණයක් සිදු කර තිබේ.

එක් එක් පීඨයේ අවශ්‍යතා මත පදනම්ව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සේවක සංඛ්‍යාව නිර්ණය කරයි. "ක්ෂේත්‍ර අධ්‍යයන" යන මාතෘකාව සමාන ලෙස පෙනුන ද අධ්‍යයන පාඨමාලාවේ විෂය පථය හා අඩංගු දේ විවිධ ය. ඇතැම් අවස්ථාවල යම් ක්ෂේත්‍රයක විශිෂ්ඨ පුද්ගලයෝ බාහිර මහාචාර්යවරුන් ලෙස ආරාධනා ලබති.

(ආ) සෑම අධ්‍යයන වර්ෂයකම ආරම්භයට පෙර සහකාර කථිකාචාර්ය, නිබන්ධක, ප්‍රදර්ශක හා උපදේශක යන තාවකාලික තනතුරු සඳහා විධිමත් ලෙස දැන්වීම් පළකරනු ලැබේ. බඳවා ගැනීම් නිසි බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව සිදු කරනු ලැබේ.

කෙසේ වුව ද, අධ්‍යයන වර්ෂයක් අතර තුර පත් කරනු ලැබූ යම් පුද්ගලයකු ඉල්ලා අස්වුවහොත් හෝ සේවයෙන් ඉවත් වුවහොත් දැන්වීම පළ කර පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් කාලයක් නොමැති විට, උපලේඛනගත කළ අධ්‍යයන කාලසටහනට අනුකූලව අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා අධ්‍යයනාංශ ප්‍රධානියාගේ හා පීඨාධිපතිවරයාගේ ඉල්ලීම මත අවස්ථා කිහිපයක දී පමණක් මෙවැනි පත්වීම් ලබා දී ඇත. ඉල්ලා අස් වූ පුද්ගලයන්ගේ පත්වීම් කාලයේ ඉතිරිය සඳහා පමණක් පත්වීම් කීපයක් සිදු කර ඇත.

(ඇ) ඉතා උත්කෘෂ්ඨ ලෙස අධ්‍යයන තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කිරීමට හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කොන්දේසිවලට අනුකූලව මේ සම්බන්ධයෙන් සෑම වෑයමක් ම දැරීමට අපි සැලකිලිමත් වන්නෙමු. සත්‍ය වශයෙන් ම ඇතැම් අංශ සඳහා නැවතත් දැන්වීම් පළ කළ ද සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීමට අපි අසමත් ව සිටිමු. එවැනි අවස්ථාවල බාහිර හෝ කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගනු ලැබේ. මෙය ද අවස්ථා කීපයක දී පමණි. මේ සම්බන්ධයෙන් සචේතනික අවධානය හා පැහැදිලිව අවබෝධයක් අපි බලාපොරොත්තු වෙමු.

3.3 (ආ) ඇතැම් පීඨවල අධ්‍යයන වර්ෂය අවසානයේදී විභාග පැවැත්වේ. ඇතැම් විට එක් එක් අධ්‍යයන වාරය අවසානයේ දී විභාග පැවැත්වේ. කෙසේ වුව ද, 1 වන අධ්‍යන වාරය අවසානයේ පැවැත් වූ විභාග වල ප්‍රතිඵල දෙවැනි අධ්‍යයන වාරයේ ප්‍රතිඵල ද සමඟ නිකුත් කෙරේ. මෙය විභාග රෙගුලාසියකි. මෙයට හේතුව වන්නේ එක් එක් අධ්‍යයන වාරය සඳහා ප්‍රතිඵල නිකුත් කළහොත් දෙවැනි අධ්‍යයන වාරයේ පාඨමාලා ඒකක පහෙන් දෙකක් අත හැරීමේ අවස්ථාව ශිෂ්‍යයන්ට ලැබීම ය. කෙසේ වුව ද, උපාධි වැඩසටහන්වල ව්‍යුහය දැනට වෙනස් කර ඇති අතර නව ශිෂ්‍ය කණ්ඩායම්වල ප්‍රතිඵල මාස තුනක් තුළ නිකුත් කරනු ලැබේ.

3.4 (අ) හා (ආ) අයදුම්කරු වටිනා ශිෂ්‍යත්වයක් ලබාගත් අවස්ථාවක් වැනි විශේෂ අවස්ථා.

3.5 අයවැය පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් පියවර ගෙන ඇත :-

(i) මූල්‍ය කමිටුව හා විශ්ව විද්‍යාල කවුන්සලය මගින් අයවැය අනුමත කෙරේ.
(ii) වෙන් කළ මුදල් සීමාව ඇතුළත වියදම් සිදුවන බව අධීක්ෂණය කිරීමේ අරමුණින් වැය ශීර්ෂ ලෙජරය පරිගණක ගත කර ඇත.
(iii) මාසික සැසඳුම් ප්‍රකාශය (වෙන් කළ මුදල් ප්‍රමාණය - සත්‍ය වියදම) මූල්‍ය කමිටුවට ඉදිරිපත් කෙරේ.
(iv) වවුනියා මණ්ඩලය සඳහා උප අග්‍රිමය විශ්ව විද්‍යාලයීය මූල්‍ය ශාඛාවේ වෙනම වැය ශීර්ෂ ලෙජරයක් පවත්වා ගැනීම මගින් අධීක්ෂණය කෙරේ.

මුල්‍යාධිකාරී විසින් සම්පාදිතය.

11-795

---

## කොළඹ විශ්ව විද්‍යාලය

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | 2011 | 2010 |
|---|---|---|
| | *රු.* | *රු.* |
| **වත්කම්** | | |
| ජංගම නොවන වත්කම් : | | |
| දේපළ පිරියත හා උපකරණ | 1,557,955,625 | 1,222,097,721 |
| කෙරීගෙන යන වැඩ | 290,478,146 | 470,553,963 |
| ආයෝජන | 1,241,366,820 | 932,065,870 |
| ජංගම නොවන වත්කම් - වෙනත් : | | |

| | 2011 රු. | | 2010 රු. | |
|---|---|---|---|---|
| විවිධ ණයගැතියෝ | 993,816 | | 9,947,816 | |
| සේවක ණය සහ අත්තිකාරම් | 131,102,004 | | 136,281,038 | |
| සැපයුම් සේවා අත්තිකාරම් | 339,580 | | 3,200,709 | |
| විවිධ අත්තිකාරම් | 49,521 | 132,484,921 | 365,610 | 149,795,173 |
| **ජංගම වත්කම්** | | | | |
| බඩු තොග | 13,012,401 | | 11,174,657 | |
| විවිධ ණයගැතියෝ | 105,275,208 | | 67,100,663 | |
| සැපයුම් සේවා ණය අත්තිකාරම් | 26,355,500 | | 2,462,952 | |
| විවිධ අත්තිකාරම් | 4,992,934 | | 4,780,058 | |
| කලින් ගෙවීම | 1,137,380 | | 1,249,875 | |
| මුදල් සහ මුදල් හා සමාන දේ | 67,868,366 | 218,641,789 | 75,083,393 | 161,851,597 |
| **මුළු වත්කම්** | | **3,440,927,300** | | **2,936,364,323** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා බැරකම් ප්‍රාග්ධනය** | | | | |
| වැය වූ මූලධන ආධාර | 1,749,428,807 | | 1,755,903,075 | |
| වැය නොවූ මූලධන ආධාර | 7,064,593 | | 451,862 | |
| ත්‍යාග හා පරිත්‍යාග | 275,586,394 | 2,032,079,794 | 55,925,427 | 1,812,280,364 |
| **සමුච්චිත අරමුදල** | | | | |
| පොදු සංචිතය | 18,958,102 | | 18,958,102 | |
| ආදායම් සහ වියදම් ගිණුම | (382,264,426) | | (478,858,774) | |
| වත්කම් යළි තක්සේරු කිරීමේ සංචිතය | 81,198,201 | (282,108,123) | 129,422,479 | (330,478,193) |
| **සංචිත සහ නිශ්චිත අරමුදල්** | | | | |
| විශේෂිත සංචිත | 577,722,890 | | 458,113,788 | |
| ප්‍රදාන අරමුදල | 71,465,428 | | 67,215,023 | |
| ත්‍යාග හා පරිත්‍යාග | 30,214 | | 30,214 | |
| වෙනත් | 14,437,565 | 663,656,097 | 14,084,271 | 539,443,296 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විලම්භිත ආදායම් පර්යේෂණ ප්‍රදාන | 122,423,058 | | 120,178,498 | |
| විලම්භිත ආදායම් ව්‍යාප්ති වැඩසටහන් | 352,433,012 | | 366,023,680 | |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම | 315,518,119 | | 305,753,563 | |
| ගෙවිය යුතු ගිණුම | 38,240,736 | | 8,825,604 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 16,816,517 | | 16,306,146 | |
| ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල ජාත්‍යන්තරීකරණය | 49,100,000 | 894,531,443 | - | 817,087,491 |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 94,062,406 | | 58,470,851 | |
| උපචිත වියදම් | 34,690,611 | | 38,797,923 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 4,015,071 | 132,768,088 | 762,593 | 98,031,367 |
| **මුළු වගකීම්** | | **3,440,927,300** | | **2,936,364,323** |

පිළියෙල කරන ලද්දේ :———,

ජී. එච්. ගාමිනි
නියෝජ්‍ය මුල්‍යාධිකාරී

සහතික කරන ලද්දේ :———,

කේ. එස්. ටී. ස්වර්ණලතා ජයසූරිය
මුල්‍යාධිකාරී

පාලක සභාව සඳහා හා ඒ වෙනුවෙන්

මහාචාර්ය ක්‍ෂනිකා හිරිඹුරේගම
උපකුලපතිනිය

ටී. එල්. ආර්. සිල්වා,
වැඩබලන ලේඛකාධිකාරී.

## කොළඹ විශ්වවිද්‍යාලය

### 2011 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

*(අගයන් ආසන්නතම රුපියලට වටයන ලදී)*

| *ආදායම්* | | *2011* | | *2010* |
|---|---|---|---|---|
| | | *රු.* | | *රු.* |
| **රජයේ ආධාර** | | | | |
| (අ) රජයේ ආධාර (පුනරාවර්තන සඳහා) | 1,224,049,934 | | 1,067,000,000 | |
| (ආ) රජයේ ආධාර - ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණ හා නඩත්තු | 38,848,348 | | 11,295,988 | |
| (ඇ) ජනනය කළ ආදායම් - ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපන හා නඩත්තු | 1,035,234 | | | |
| (ඈ) ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | 205,621,109 | | 181,143,224 | |
| (ඈ) ශිෂ්‍යාධාර සඳහා ආධාර | 26,624,900 | | 28,764,700 | |
| (ඉ) මහපොළ සඳහා ප්‍රදානය (i) විවිප්‍රකො | 14,898,450 | | 17,177,650 | |
| (ii) මහපොළ භාරකාර අරමුදල් සංරචකය | 103,211,550 | | 116,072,300 | |
| (ඊ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තරීකරණය කිරීම | 52,750,000 | | - | |
| (එ) කාර්ය මණ්ඩල සංවර්ධන කේන්ද්‍රය සඳහා විවිප්‍රකො ප්‍රදානය | 5,000,000 | 1,672,039,525 | - | 1,421,453,863 |
| ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි) | 2,945,755 | | 3,636,449 | |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | 898,482 | | 839,752 | |
| අධ්‍යයන ගාස්තු (ප්‍රථම උපාධි) | 29,936,623 | | 10,058,556 | |
| අධ්‍යයන ගාස්තු (පශ්චාත් උපාධි) | 7,905,000 | | 3,999,785 | |
| විභාග ගාස්තු (ප්‍රථම උපාධි) | 112,310 | | 113,105 | |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | 827,025 | | 721,350 | |
| ණය සහ අත්තිකාරම් වලින් පොලිය | 5,293,686 | | 5,344,774 | |
| අයෝජන පොලී | 57,294,943 | | 41,476,603 | |
| ප්‍රකාශන විකිණීම් | 825 | | 2,400 | |
| දේපළ කුළී ආදායම් | 833,425 | | 1,036,928 | |
| වෛද්‍ය ගාස්තු | 910,000 | | 571,900 | |
| පුස්තකාල දඩ | 826,925 | | 765,288 | |
| ව්‍යාපාරික කටයුතු වලින් | 4,872,400 | | 3,085,679 | |
| සුළු මිශ්‍ර ආදායම් | 13,438,975 | | 14,519,400 | |
| විදේශ විනිමය හුවමාරු ලාභය | 203,958 | | - | |
| ගිවිසුම් කඩ කිරීමෙන් ආදායම | 5,571,660 | | 5,168,304 | |
| බාහිර පාඨමාලා ආදායම් | 275,349,750 | | 255,065,984 | |
| පර්යේෂණ ව්‍යාපෘති අරමුදල් ආදායම් | 100,823,637 | | 152,189,438 | |
| බාහිර/පර්යේෂණ පාඨමාලාවලින් ආදායම් | 2,363,743 | | 14,166,042 | |
| ප්‍රදානයන් ලැබීම් | 1,505,017 | 511,914,139 | 1,842,683 | 514,604,420 |
| | | **2,183,953,664** | | **1,936,058,282** |
| ***වියදම්*** | | | | |
| **පුද්ගල පඩිනඩි** | | | | |
| වැටුප් හා වේතන | 499,662,231 | | 500,850,046 | |
| වි.අ.අ./සේ.භා.අ./විශ්‍රාම වැටුප් | 112,872,210 | | 97,272,931 | |
| දීමනා | 238,823,116 | | 166,192,217 | |
| පර්යේෂණ දීමනා | 49,626,559 | | - | |
| අතිකාල/නිවාඩු දින ගෙවීම් | 28,415,791 | | 28,633,989 | |
| ගමන් වියදම් | 3,049,546 | | 2,999,853 | |
| සැපයීම් | 65,856,103 | | 63,183,193 | |
| වත්කම් නඩත්තු | 19,509,962 | | 16,449,106 | |
| ගිවිසුම් සේවා | 184,424,376 | | 166,111,398 | |
| වෙනත් | 47,609,610 | | 40,658,135 | |
| (i) මහපොළ ශිෂ්‍යත්ව -වි.වි.ප්‍ර.කො. | 14,930,735 | | 18,004,550 | |
| (ii) මහපොළ අරමුදල් සංරචකය (වියදම්) | 103,211,550 | | 116,072,300 | |
| ශිෂ්‍යාධාර | 26,547,100 | | 28,715,200 | |
| ක්ෂය | 205,621,109 | | 181,143,224 | |

| *ආදායම්* | | *2011* *රු.* | | *2010* *රු.* |
|---|---|---|---|---|
| පාරිතෝෂික වෙන්කිරීම් | 40,364,067 | | 23,540,775 | |
| ව්‍යාප්ති පාඨමාලා වියදම් | 275,349,750 | | 255,065,984 | |
| පර්යේෂණ ප්‍රදාන වියදම් | 100,823,637 | | 152,189,438 | |
| ප්‍රදාන හා ශිෂ්‍යත්ව | 1,505,017 | | 1,842,683 | |
| විදේශ විනිමය හුවමාරු පාඩුව | - | | 296,028 | |
| ගොඩනැගිලි (පුනරාවර්තන) (පුනරුත්ථාපන) | 38,848,348 | | 11,295,988 | |
| ප්‍රාග්ධන වත්කම් නඩත්තු හා පුනරුත්ථාපන සඳහා ජනනය කළ අරමුදල් | 1,035,234 | | - | |
| ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ජාත්‍යන්තරීකරණය සඳහා වෙන් කිරීම් | 49,100,000 | | - | |
| ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ජාත්‍යන්තරීකරණය සඳහා වියදම | 3,650,000 | | - | |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමේ මත අලාභය | 3,734,795 | | - | |
| වියදම් - කාර්යාල දැවභාණ්ඩ හා උපකරණ ජනනය කළ අරමුදල් ඌනතාවය | - | 2,114,570,845 | 8,377,456 | 1,878,894,494 |
| **වියදම මත ආදායමෙහි අතිරික්තය** | | **69,382,819** | | **57,163,789** |

**ආදායම් හා වියදම්**
**විසර්ජන ගිණුම**

| | | |
|---|---|---|
| ආදායම් සහ වියදම් ගිණුම් ශේෂය | 69,382,819 | 57,163,789 |
| පසුගිය වසර සඳහා ගැලපීම් | 27,211,530 | (57,163,789) |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය ඉ/ගෙන ගියා | (478,858,774) | (478,858,774) |
| ශේෂය ශේෂ පත්‍රයට ගෙන ගියා | **(382,264,426)** | **(478,858,774)** |

උපකුලපති,
කොළඹ විශ්වවිද්‍යාලය.

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර කොළඹ විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 *මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 *විගණකගේ වගකීම*

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල බවට සහ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ

ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 *තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම :*

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 *මතය*

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන බව මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම :*

2.2.1 *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති :*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 29 පටහැනිව පාඨමාලා ආදායම් වියදම් ගිණුම්ගත කිරීමේ දී වර්ෂ කිහිපයක් වෙනුවෙන් ලැබෙන බැවින් ඒ ඒ වර්ෂවලට අනුරූපී ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් පාඨමාලා වියදමට සමාන ප්‍රමාණයක් වූ රු. 275,349,750 ක් එහි ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.2. *ගිණුම්කරණ අඩුපාඩු :*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබුණි. ගිණුම් විගණනය කිරීමෙන් පසුව 2012 ජූලි 19 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ රු. 387,410,330 ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර එම ගිණුම්කරණ අඩුපාඩු වලින් රු. 329,865,338 ක් නිවැරදිකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 අගෝස්තු 07 දින ඉදිරිපත් කරන ලදී. තෝරාගන්නා ලද නියැදියෙන් බාහිරට තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේ දී බැහැර කළ නොහැක.

(ආ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ජාත්‍යන්තරකරණය ව්‍යාපෘතියට ලැබී තිබුණු රු. 52,750,000 ක මූල්‍ය ප්‍රදානය මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන ප්‍රදානයක් ලෙස දක්වා තිබුණි.

2.2.3 *නොසැසඳූ පාලන ගිණුම් :*

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාල මන්දිරයේ ප්‍රකාශන හා පොත්වල වටිනාකම රු. 279,827,114 ක් ලෙස ලෙජර් ගිණුමේ පෙන්වා තිබුණු අතර 2011 වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේ දී එහි අගය රු. 284,622,106 ක් ලෙස යොදාගෙන තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් වටිනාකම සහ ක්ෂය ගණනය කිරීම සඳහා යොදාගන්නා ලද වටිනාකම අතර අගය රු.4,794,992 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය.

2.2.4 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවාගත් රු. 7,447,561 ක විවිධ හේතුමත නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය වෙත ලබාදී තිබූ රු. 1,027,455 ක් වූ ආපදා ණය ශේෂයක්ද, රු.82,500 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂයක්ද, රු. 61,000 ක් වූ වාහන ණය ශේෂයක්ද, රු.45,390 ක් වූ සේවක ණය ශේෂයක්ද, රු. 26,600 ක් වූ විශේෂ අත්තිකාරම් ශේෂයක් ද, රු.22,500 ක් වූ පරිගණක ණය ශේෂයක්ද, අයකර ගැනීම කල් ඉකුත් වී තිබුණි.

(ඇ) *ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් ලැබිය යුතු මුදල් :*

(i) නියැදි පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි ආචාර්යවරුන් 08 දෙනෙක් විසින් විශ්වවිද්‍යාලය සමග ඇතිකරගෙන තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් 1982 සිට 1986 දක්වා සේවය හැරගිය ආචාර්යවරුන් 04 දෙනෙක් සහ 1990 සිට 1992 දක්වා සේවය හැරගිය ආචාර්යවරුන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.6,514,032 ක් වූ බැඳුම්කර මේ දක්වා අයකරගැනීමට කටයුතු නොකිරීම නිසා කාලාවරෝධයට යටත්වීම හේතුවෙන් එම මුදල් අයකරගැනීම අවිනිශ්චිතව තිබුණි.

(ii) ආචාර්යවරුන් 17 දෙනෙකුගෙන් අයකරගත යුතු රු. 7,922,373 ක මුදලක් ආචාර්යවරුන් විසින් පාරිතෝෂික හෝ විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලින් අයනොකිරීම හා නඩු තීන්දු මගින් ගෙවීමට නියෝග කර ඇතත්, එම මුදල් 2011 දෙසැම්බර් 31 වන විටත් ගෙවා නොතිබුණු අතර ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.5 *නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :*

ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාර පහත සඳහන් අත්තිකාරම් පියවීම් කර නොතිබුණි.

(i) පර්යේෂණ හා කළමණාකරණ ඒකකයේ නිලධාරීන් දෙදෙනෙකු විසින් ලබාගෙන තිබූ රු. 395,370 ක අත්තිකාරම් 2012 අප්‍රේල් 27 දින වන විටත් පියවා නොතිබුණි.

(ii) ගෙවීම් අංශයේ අවස්ථා 05 කදී රු. 321,000 ක් වූ අත්තිකාරම් හා පර්යේෂණ හා කළමණාකරණ ඒකකයේ අවස්ථා 32 කදී ලබාගත් රු. 2,762,832 අත්තිකාරම් දින 50 සිට දින 850 දක්වා ප්‍රමාද වී පියවීම් කර තිබුණි.

2.2.6 *අධිකාරි බලය නොලත් ගනුදෙනු :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98(i), 07/2007(i) හා 02/2009 චක්‍රලේඛවලට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි අංක 6/2003 අනුව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනතාවය වෙනුවෙන් රු. 1,528,848ක් ගෙවා තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 *මූල්‍ය ප්‍රතිඵල :*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.1,193,515,463 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු. 1,021,132,200ක් විය. පුනරාවර්තන වියදම් සහ නඩත්තු වියදම් සඳහා රු. 1,262,898,282 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 69,382,819 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.1,078,295,988 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌණතාවය රු. 57,163,789 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වාසිදායක තත්ත්වයට සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබූ රු. 184,602,294ක රජයේ ප්‍රදාන වැඩිවීම හා ආයෝජන ආදායමට රු.15,818,340 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4 **මෙහෙයුම් සමාලෝචනය**

4.1 *කාර්යසාධනය*

(අ) *විභාග ප්‍රතිඵල :*

2010/2011 අධ්‍යයන වර්ෂයේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම් පිළිබඳ පහත නිරීක්ෂණය කරනු ලැබේ :

(i) ශාස්ත්‍ර පීඨයේ සාමාන්‍ය උපාධි විභාග සඳහා සිසුන් 797 ක් පෙනී සිටි අතර ඉන් සිසුන් 135 ක් ඌන සමත්/අසමත් විය. ඒ අනුව ඌන සමත්/අසමත් සිසුන් සංඛ්‍යාව මුළු සිසුන් සංඛ්‍යාවෙන් 17% ක් විය.

(ii) 2010/2011 අධ්‍යයන වර්ෂය තුල කලා පීඨයේ පශ්චාත් උපාධි 06 ක සහ පශ්චාත් ඩිප්ලෝමා 02 ක් ද (Graduate Studies) උපාධි අධ්‍යයන පීඨයේ 03 ක ද විද්‍යා පීඨයේ පශ්චාත් උපාධි 06 ක් ද නීති පීඨයේ පශ්චාත් උපාධි 01 ක විභාග ප්‍රතිඵල නිකුත් කිරීම වසරකට වඩා ප්‍රමාද වී තිබුණි.

(ආ) *පර්යේෂණ :*

(i) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ප්‍රකාශන අංශයේ තොරතුරු අනුව ආචාර්යවරුන් 08 දෙනෙකු විසින් 2000/2001 වර්ෂය තුළ පර්යේෂණ සඳහා රු. 876,469 ක අරමුදල් ලබාගෙන තිබුණද, එම පර්යේෂණ අවසන් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ii) 2011 අප්‍රේල් 04 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 45 හි 4(අ) උපඡේදයේ හා 5 (අ) ඡේදය ප්‍රකාරව පර්යේෂණ දීමනා ලබන නිලධාරීන් විසින් පර්යේෂණ කල රාමුව හා ක්‍රමවේදය ඇතුළත් පර්යේෂණ යෝජනාවක් විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් පිළිගත් පර්යේෂණ කළමණාකරණ සඳහා කමිටු/සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ පර්යේෂණ යෝජනා අනුමත කර නොගත් විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්යමණ්ඩලයේ කථිකාචාර්යවරුන්, ආචාර්යවරුන්, පුස්තකාල කාර්යමණ්ඩලයේ නිලධාරීන් 497 කට සමාලෝචිත වර්ෂයේ දී පර්යේෂණ දීමනා ලෙස රු. 48,488,274ක් ගෙවා තිබුණි.

4.2 *කළමණාකරණ ආකාර්යක්ෂමතා*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව සේවයෙන් විශ්‍රාම යන නිලධාරීන්ට හිමි පාරිතෝෂික මුදල් එම නිලධාරියා විශ්‍රාම ගොස් මසක් ඇතුළත ගෙවිය යුතු බවත් 2010 ජනවාරි 02 දින සේවයෙන් විශ්‍රාමගිය සහකාර ලේඛකාධිකාරිවරයෙකුට පාරිතෝෂික ගෙවීම ප්‍රමාද වීම නිසා රු. 66,526 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) *නේවාසිකාගාර පරිපාලනය*

(i) සමාලෝචිත වර්ෂයේ සිසුන් 312 කට නේවාසික පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාර 04 ක් රු. 8,009,880 ක කුලී ගෙවා බාහිර පාර්ශවයන්ගෙන් ලබාගෙන තිබූ අතර එම නේවාසිකාගාර කුලිය තීරණය කිරීමේ දී රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාලය සතු රත්මලාන තෙලවල පිහිටි අක්කර 01 රූඩ් 01 පර්චස් 32.58 ක ඉඩමක ඉදිකර තිබූ පිරිවැය රු. 25,127,448 ක් වූ සිසුන් 500 කට පමණ නේවාසිකාගාර පහසුකම් සැලසීමට හැකි නේවාසිකාගාරය 2010 අගෝස්තු සිට වසා දමා තිබුණි.

(iii) එම නේවාසිකාගාරයේ 2009 දෙසැම්බර් 31 දින දක්වා යාවත්කාලීන කර විගණනයට ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් ලේඛනයට අනුව පිරිවැය රු. 2,599,800 ක් වූ එම නේවාසිකාගාරයේ ලීබඩු හා උපකරණ ඌණ උපයෝජිතව තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) *නිල නිවාස පරිපාලනය*

(i) වසර කිහිපයක සිට නිල නිවාස 03 ක පදිංචිවී සිටින නිලධාරීන් සමග විශ්වවිද්‍යාලය ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාල නිලධාරීන්ට නිල නිවාසයක පදිංචිවී සිටිය හැකි උපරිම කාලය වසර 2 ක් වුවද එම කාලය ඉක්මවා ඇතැම් නිලධාරීන් වසර 3 සිට 7 ක්වා දීර්ඝ කාලයක් ගිවිසුම් සංශෝධනය කිරීමකින් තොරව ඒවායේ පදිංචිව සිටින බව අනාවරණය විය.

4.3 *අධ්‍යයන කාර්ය මණ්ඩලය*

විශ්ව විද්‍යාලය ආචාර්යවරුන්ගෙන් අනුමත කාර්ය මණ්ඩලයේ 612 ක් වූ අතර ආචාර්යවරු 50 ක් අධ්‍යයන නිවාඩු හා 49 ක් සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබුණි. අනුමත කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව 116 ක් වූ බැවින් අධ්‍යයන කටයුතු වල නියුතු ආචාර්යවරුන් සංඛ්‍යාව 397 ක් විය. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව 64.86% ක් පමණක් අධ්‍යයන කටයුතුවල නිරත වන බව නිරීක්ෂණය විය.

**5. ගිණුම්කටයුතු භාවය සහ පාලනය**

5.1 *වාර්ෂික වාර්තා සභාගත කිරීම*

2009 වාර්ෂික වාර්තාව 2011 මැයි 19 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට භාර දී තිබුණු අතර 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2012 අගෝස්තු 15 අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණි.

**6 පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කලයුතුවේ.

(අ) අත්තිකාරම්,
(ආ) ස්ථාවර වත්කම්,
(ඇ) ගිවිසුම්ගත බැදීම්.

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

11-782

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

2010 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගිණුම්

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ සාමාජිකයන් වෙත ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව**

***1975 අංක 2 දරන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම නීතියේ 13(5) වගන්තිය අනුව 2010 වර්ෂයේ වාර්තාව***

01. *පාලක මණ්ඩලය*

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා - සභාපති
එම්. ඩී. ඩී. පීරිස් මහතා, තාවකාලික සභාපති.
මහාචාර්ය ඒ. වී. සුරවීර මහතා
නිහාල් රොඩ්රිගෝ මහතා
සුනිමල් ප්‍රනාන්දු මහතා
සිවා ඔබේසේකර මහත්මිය

සමාලෝචනයට ලක්වන වසර තුළ දී යම් යම් නිශ්චිත සේවා ඉටු කිරීමේ වගකීම පහත දැක්වෙන රාජ්‍ය නියෝජිත ආයතන සහ දෙපාර්තමේන්තු විසින් අඛණ්ඩව දරනු ලැබූ අතර ඔවුන් ලබා දුන් සහාය වෙනුවෙන් අපි ස්තුතිය පළ කරමු.

(අ) සී.ස. ශ්‍රී ලංකා ටෙලිකොම් - ශබ්ද විකාශන සහ දුරකථන උපකරණ නඩත්තුව,

(ආ) පොලිස් දෙපාර්තමේන්තුව - ආරක්ෂාව සහ පොදු රාජකාරි,

(ඇ) රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ් - අතිරේක ආරක්ෂක සේවා.

02. **ආහාර පාන සැපයීම - සී. ස. ගල්කිස්ස හෝටල් සමාගම**

2009 දී පදනම ඉපැයූ කොමිස් මුදල වන රු. 31,365,769 හා සැසඳීමේ දී 2010 දී එය ඉපැයූ කොමිස් මුදල රු. 17,303,846ක් විය.

03. 2010 වසර තුළ දී බණ්ඩාරනායක ජාතික අනුස්මරණ ශාලාවේ දී සිදු කරන ලද වැදගත් ක්‍රියාකාරීත්වයන්ගෙන් සමහරක් පහත දැක්වේ :

* ජාත්‍යන්තර ආයුර්වේද සමුළුව,
* බොන්ෂුවා සිනමා උළෙල, ප්‍රංශ තානාපති කාර්යාලය,
* වාස්තු විද්‍යා ප්‍රදර්ශනය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය,
* බක්මහ/නත්තල් සාප්පු සවාරි උත්සවය. BMICH,
* INCO ප්‍රදර්ශනය - ඉන්කෝපරේටඩ් ඉංජිනියර්ස් ඔෆ් ශ්‍රී ලංකා,
* ආසියා ශාන්තිකර දන්ත වෛද්‍ය කොංග්‍රසය,
* IIFA විලාසිතා දැක්ම,
* සංචරණ හා සංචාරක ජනාධිපති සම්මාන ප්‍රදානය,
* පොත් ප්‍රදර්ශනය, ශ්‍රී ලංකා ග්‍රන්ථ ප්‍රකාශකයින්ගේ සංගමය,
* ඉදිකිරීම් - 2010 : ඉදිකිරීම් සංවිධානය,
* මෙඩිසිනා ඕල්ටර්නේටිවා සමුළුව,
* FACETS ප්‍රදර්ශනය, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය.

2010 වසරේ දී පහසුකම් කුලියට ලබාදීමෙන් ඉපැයූ මුළු ආදායම රු. 128,734.056ක් වූ අතර 2009 දී එය රු. 140,285,284ක් විය.

2010 දෙසැම්බර් 31 දිනට එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ද, මූලික ගිණුම් ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන් ද සමගින් එකී පදනමේ මූල්‍ය ප්‍රකාශ අපි විගණනය කළෙමු.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මේ මූල්‍ය ප්‍රකාශන සකස් කොට සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ. මේ වගකීමට ඇතුළත් වන්නේ ; අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යෑම ; වංචා හෝ දෝෂයන් හේතු කොටගෙන හෝ වේවා, මූල් සාවද්‍ය ප්‍රකාශනවලින් තොරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ; යෝග්‍ය විගණන ප්‍රතිපත්ති තේරීම සහ යොදා ගැනීම සහ අවස්ථාවන් අනුව සාධාරණ වන ගිණුම් ඇස්තමේන්තු සිදු කිරීම යන කරුණු වේ.

**විගණන විෂය පථය සහ මතයේ පදනම**

අපේ වගකීම වන්නේ අපේ විගණනය පදනම් කරගෙන මේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමය. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව අපි අපගේ විගණනය සිදු කළෙමු. එකී ප්‍රමිතීන් අනුව, මුදල් ප්‍රකාශන මූලික සාවද්‍ය සඳහන් කිරීම්වලින් තොර ද යන්න සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාගැනීම සඳහා විගණනය සැලසුම් කිරීම හා පැවැත්වීම අප විසින් සිදු කරනු ලැබිය යුතු ය.

විගණනයකට ඇතුළත් වන්නේ මුදල් ප්‍රකාශනවල දැක්වෙන ප්‍රමාණයන් සහ අනාවරණය කිරීම් පරීක්ෂණ පදනමකින් පරීක්ෂා කර බැලීමය. එසේ ම, කළමනාකාරිත්වය විසින් භාවිත කරන ගිණුම් මූලධර්ම සහ සිදු කරන ලද මූලික ඇස්තමේන්තුව තක්සේරු කිරීමත්, එසේ ම සමස්ථ මුදල් ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගැයීමත් විගණනයකට තවදුරටත් ඇතුළත් වේ.

අපේ උපරිම දැනුම හා විශ්වාසය අනුව, අපේ විගණනය සඳහා අවශ්‍ය යැයි අප සලකන සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගත්තෙමු. එබැවින්, අපේ මතය සඳහා සාධාරන පදනමක් අපේ විගණනයෙන් සැපයෙන්නේ යැයි අපි විශ්වාස කරමු.

**මතය**

අපේ මතය අනුව, අපේ පරීක්ෂණයෙන් පෙනී යන පරිදි, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විධිමත් ගිණුම් තැබීමේ ලේඛන පදනම විසින් පවත්වාගෙන යනු ලැබ ඇති අතර 2010 දෙසැම්බර් 31 දිනට පදනමේ කාර්ය තත්ත්වය පිළිබඳවත්, එදිනෙන් අවසන් වූ වර්ෂය තුළ ඒවායේ මෙහෙයුම්වල හා මූල්‍ය ප්‍රමාණයන්හි ප්‍රතිඵල පිළිබඳවත් සත්‍ය හා සාධාරණ අදහසක් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව එමගින් ලබා දේ.

2012 අගෝස්තු 02 දින,
වරලත් ගණකාධිකාරීවරු,
කොළඹ.

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන | 2010<br>රු. | 2009<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ යන්ත්‍ර හා උපකරණ | 14 | 918,296,549 | 822,965,164 |
| කාර්ය මණ්ඩල ණය | 15 | 13,250,415 | 12,130,074 |
| සිදුවෙමින් පවතින වැඩ - ඉදිකිරීම් | | 14,955,412 | 21,381,473 |
| ගොඩනැගිලි වැඩි දියුණු කිරීම | | 24,349,144 | 22.074,934 |
| | | 970,851,520 | 878,551,645 |
| **ජංගම වත්කම්** | | | |
| ඉන්වෙන්ටරි | | 52,469,913 | 47,179,601 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | | 242,359,462 | 229,346,618 |
| කෙටිකාලීන ආයෝජන | 16 | 277,471,833 | 271,876,177 |
| බැංකු හා මුදල් ශේෂ | | 28,554,045 | 10,821,590 |
| | | 600,855,253 | 559,223,986 |
| මුළු වත්කම් | | 1,571,706,773 | 1,437,775,631 |

| | සටහන | 2010 රු. | 2009 රු. |
|---|---|---|---|
| **අරමුදල් හා බැරකම්** | | | |
| සමුච්චිත අරමුදල | 17 | 522,904,218 | 452,093,077 |
| ප්‍රාග්ධන සංචිත | | 925,522 | 925,522 |
| | | 523,829,740 | 453,018,599 |
| **විශේෂිත අරමුදල්** | | | |
| ප්‍රාග්ධන ආධාර අරමුදල් | 18 | 541,653,179 | 541,653,179 |
| නඩත්තු ආධාර අරමුදල් | | 25,942,983 | 25,942,983 |
| පුස්තකාල පොත් ප්‍රදාන අරමුදල | | 212,377 | 212,377 |
| අලුත්වැඩියා සහ නඩත්තු සංචිත | | 4,164,226 | 4,164,226 |
| විවිධ අරමුදල් | 19 | 4,919,126 | 4,919,126 |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශිෂ්‍යත්ව අරමුදල | | 100,000 | 100,000 |
| | | 576,991,891 | 576,991,891 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 20 | 30,840,321 | 26,021,538 |
| දිගු කාලීන ණය | 21 | 3,207,196 | 5,164,718 |
| විලම්බිත ආදායම | 22 | 2,700,992 | 3,368,328 |
| | | 36,748,511 | 34,554,584 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් | | 190,602,942 | 132,966,356 |
| වසරක් තුළ ගෙවිය යුතු කෙටිකාලීන බැරකම් | | 3,150,645 | 2,839,395 |
| පොදු තැන්පතු | | 230,863 | 230,863 |
| බැංකු අයිරා | | 240,152,181 | 237,173,943 |
| | | 434,136,631 | 373,210,557 |
| **සම්පූර්ණ කොටස් හා බැරකම්** | | 1,571,706,773 | 1,437,775,631 |

මුදල් කළමනාකරු ..............................

අත්සන                    දිනය

අධ්‍යක්ෂවරු    1 ..................................................

2 ..................................................

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශන ගිණුම

| | | සටහන් | 2010 රු. | 2009 රු. |
|---|---|---|---|---|
| **ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්ගෙන් ලද ආදායම** | | | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික | ශාලාව හා පහසුකම් කුලියට දීම | | 128,734,056 | 140,285,284 |
| අනුස්මරණ පදනම | පොලී ආදායම | | 24,030,181 | 43,594,813 |
| | ලැබුණු කොමිස් මුදල් | | 17,303,846 | 31,365,769 |
| | බලපත්‍ර ගාස්තු | | 99,445,642 | 100,036,048 |
| බ.ජා.අ.ම. ආදායම | | 6 | 18,912,672 | 20,238,918 |
| BMICH සත්කාරක සේවා | | 7 | 104,838,512 | 79,074,013 |
| | | | 393,264,909 | 414,594,845 |

| | | සටහන් | 2010 රු. | 2009 රු. |
|---|---|---|---|---|
| **එකතු කළා : වෙනත් ආදායම්** | | | | |
| විවිධ ආදායම් | | | 17,509,527 | 4,176,997 |
| මහජනයා ශාලාව නැරඹීම | | | 325 | 119,335 |
| ශබ්ද විකාශන ගාස්තු | | | 2,648,700 | 1,990,000 |
| පොප්කෝන් අලෙවි ගිණුම | | | 871,759 | 556,590 |
| ප්‍රදාන | | | 81,074,000 | - |
| SAARC මගින් ශුද්ධ ආදායම | | | - | 26,347,694 |
| කල් ඉකුත් වූ චෙක්පත් කපා හැරීම | | | 1,680,717 | - |
| | | | 497,049,937 | 447,785,461 |
| අඩුකළා : වියදම් | | | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | පොදු කළමනාකරණය | 8 | 132,157,235 | 140,888,194 |
| | පොදු අලුත්වැඩියාවන් සහ නඩත්තුව | 9 | 12,979,232 | 21,028,893 |
| | කාර්ය මණ්ඩල පරිපාලන වියදම් | 10 | 103,860,533 | 104,983,428 |
| | ක්ෂයවීම් | 11 | 13,135,905 | 13,170,994 |
| බ.ජා.අ.ම. වියදම් | | 12 | 21,131,757 | 19,776,250 |
| BMICH සත්කාරක සේවා වියදම් | | 13 | 142,080,465 | 100,038,452 |
| | | | (425,345,127) | (399,886,211) |
| **වර්ෂයේ අතිරික්තය** | | | 71,704,810 | 47,899,250 |

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2010 රු. | 2009 රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | |
| වර්ෂයේ අතිරික්තය | 71,704,810 | 47,899,250 |
| ගැලපීම්/හෝ ක්ෂයවීම් | 18,552,860 | 18,856,149 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 6,230,848 | 3,297,283 |
| පොලී ආදායම | (28,603,439) | (43,594,813) |
| ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරීම | (667,336) | - |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය | 67,217,743 | 26,457,869 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වල වැඩිවීම්/(අඩුවීම්)** | | |
| ඉන්වෙන්ටරි | (5,290,312) | 26,054,139 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් | (13,070,184) | (113,270,067) |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් | 57,882,026 | 60,762,592 |
| | 106,739,272 | 4,532 |
| ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික | (1,600,165) | (1,100,665) |
| මෙහෙයුම් ක්‍රියාකාරිත්වයන්ගෙන් ලද ශුද්ධ මුදල් (වැයවීම්)/ලැබීම් | 105,139,107 | (1,096,133) |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයන්ගෙන් මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, යන්ත්‍ර සහ උපකරණ ලබා ගැනීම | (107,458,184) | (101,041,307) |
| ලැබුණු පොලී | 28,603,439 | 43,594,813 |
| දේපළ, යන්ත්‍ර සහ උපකරණ අලෙවියෙන් ලත් මුදල් | - | 8,563,220 |
| විවිධ අරමුදල් | (893,668) | - |

| | *2010* | *2009* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| සවරින් රෙසිඩන්ස් ආයෝජනය | (2,274,210) | - |
| | 23,116,484 | (49,979,407) |
| **මූල්‍ය සම්පාදන කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රදානය කරන ලද කාර්ය මණ්ඩල ශුද්ධ ණය | (1,120,341) | 933,799 |
| වසර තුළ ලබාගන්නා ලද ණය (ශුද්ධ) | (1,646,270) | (2,839,395) |
| ලැබුණු ශුද්ධ ප්‍රදානයන් | - | 2,050,902 |
| මුදල් සහ මුදල් හා සමාන විෂයයන්හි අඩුවීම | 20,349,873 | (49,834,101) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන විෂයයන් (සටහන 'අ') | 45,523,824 | 95,357,925 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන විෂයයන් (සටහන් 'ආ') | 65,873,697 | 45,523,824 |
| (අ) වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන විෂයයන් | | |
| කෙටි කාලීන ආයෝජන | 271,876,177 | 261,799,029 |
| බැංකු ශේෂය සහ අතැති මුදල් | 10,821,590 | 7,388,206 |
| බැංකු අයිරා | (237,173,943) | (173,829,310) |
| | 45,523,824 | 95,357,925 |
| (ආ) වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන විෂයයන් | | |
| කෙටි කාලීන ආයෝජන | 277,471,833 | 271,876,177 |
| බැංකු ශේෂය සහ අතැති මුදල් | 28,554,045 | 10,821,590 |
| බැංකු අයිරා සහ අතැති මුදල් | (240,152,182) | (237,173,943) |
| | 65,873,696 | 45,523,824 |

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 2010 දෙසැම්බර් මස 31 වැනි දින

1. **ගිණුම් ප්‍රතිපත්ති**
   **පොදු ගිණුම් සම්මුතිය**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ වත්කම් අත්පත් කර ගැනීම, බැරකම් සිදුවීම හෝ ප්‍රාග්ධනය ලබා ගැනීම සිදු වූ දිනවල පැවති වටිනාකම් අනුව ගනුදෙනු වාර්තා කරනු ලබන ඓතිහාසික පිරිවැය සම්මුතිය අනුව ය. තව ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට ද මූල්‍ය ප්‍රකාශන අනුකූල වේ.

1.2 ප්‍රවර්තන වර්ෂයේ තත්ත්වය සනාථ කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවලදීම කලින් වර්ෂයේ සංඛ්‍යා සහ යෙදුම් නැවත සකස් කරන ලදී.

1.3 **ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු සිදු වූ සියලුම වැදගත් සිදුවීම් සලකා බලනු ලැබ ඇති අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීම් කරනු ලැබ ඇත.

2. **වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම**

2.1 **දේපළ, යන්ත්‍ර සහ උපකරණ**

දේපළ, යන්ත්‍ර සහ උපකරණ අත්පත් කර ගැනීමේ දී, වැඩි දියුණු කිරීමේ දී හෝ අලුතින් එකතු කිරීමේ දී දරන ලද පිරිවැය ප්‍රාග්ධන වියදමක් වශයෙන් සලකනු ලැබ ඇත. දේපළ, යන්ත්‍ර සහ උපකරණ වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් අඩුකර පිරිවැයට ය.

2.2 **ක්ෂයවීම**

ක්ෂයවීම ගණනය කර ඇත්තේ පහත දැක්වෙන ප්‍රමාණයන් භාවිත කරමින් අදාළ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ අඩුවන ශේෂ ක්‍රමය පදනම් මත දේපළ, යන්ත්‍ර හා උපකරණ පිරිවැය කපා හැරීම සඳහා ය.

| | | *බ. ජා. අ. ම* | *BMICH සත්කාරක සේවා* |
|---|---|---|---|
| ගොඩනැගිලි | 12.5% | - | - |
| යන්ත්‍ර හා උපකරණ | 12.5% | - | - |
| මෝටර් වාහන | 12.5% | 25% | 12.5% |
| කාර්යල උපකරණ | 12.5% | 25% | 12.5% |
| ගෘහභාණ්ඩ සවිකිරීම | 12.5% | 2.5% | 12.5% |
| අංගණ හා උද්‍යාන | 12.5% | 12.5% | - |
| TV උපකරණ | 12.5% | 12.5% | - |
| උද්‍යාන උපකරණ | 12.5% | 12.5% | - |
| සමුළු පද්ධතිය | 12.5% | 12.5% | - |
| බ. ජා. අ. ම. උපකරණ | 12.5% | 12.5% | - |
| වෙනත් උපකරණ | 12.5% | 12.5% | - |
| ගිනි අන්තරාය පද්ධතිය | 12.5% | 12.5% | - |
| බුමුතුරුණු හා තිරරෙදි | 12.5% | 12.5% | - |
| හැඳි, ගැරුප්පු ආදිය හා පිඟන් භාණ්ඩ | 12.5% | 12.5% | 12.5% |
| බ. ජා. අ. ම. පුස්තකාල පොත් | - | 20% | - |
| විදුලිය උපකරණ | 12.5% | - | 12.5% |
| විවිධ වත්කම් | 12.5% | 25% | - |
| යන්ත්‍ර හා උපකරණ | - | - | 12.5% |
| ලිනන් | - | - | 12.5% |
| මුළුතැන්ගෙයි උපකරණ | - | - | 12.5% |

ක්ෂයවීම් සඳහා පූර්ණ ප්‍රතිපාදන සිදුකර ඇත්තේ මිල දී ගැනීම් කරන මාසය තුළ වන අතර, බැහැර කිරීමේ මාසය තුළ දී ක්ෂයවීම් අඩුකර නැත.

2.3 **බදු වත්කම්**

සැලකිය යුතු ප්‍රතිලාභ සහ අයිතිය පිළිබඳ අවදානම් පැවරෙන දේපළ, යන්ත්‍ර හා උපකරණ සඳහා මූල්‍ය සම්පාදනය සිදු වී ඇත්තේ බදුදීමේ ක්‍රියා මාර්ගවලින් වන අවස්ථාවල දී වත්කම් සලකනු ලබන්නේ ඒවා එකවර ම මිළ දී ගන්නා ලද සේ සලකා වන අතර, ඉහත දක්වන ලද ප්‍රමාණයන් අනුව ක්ෂය කරන ලද දේපළ, යන්ත්‍ර හා උපකරණ ඒවාට ඇතුළත් වේ. බදු වියදමේ ප්‍රාග්ධන අංග පෙන්වා ඇත්තේ මූල්‍ය බද්ද යටතේ බැඳීමක් වශයෙනි.

2.4 **ඉන්වෙන්ටරි**

ඉන්වෙන්ටරි දක්වා ඇත්තේ ඇස්තමේන්තු ගත පදනමක් මතය.

2.5 **කෙටි කාලීන ආයෝජන**

කෙටි කාලීන ආයෝජන තක්සේරු කරනු ලබන්නේ වඩා අඩු පිරිවැය හෝ වෙළෙඳ පොළ අගය අනුවය.

2.6 **වෙළෙඳ ලැබීම් සහ අනෙකුත් ලැබීම්**

වෙළෙඳ ලැබීම් සහ අනෙකුත් ලැබීම් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ඒවායේ ඇස්තමේන්තුගත උපලබ්ධි ප්‍රමාණයන්ටය.

2.7 **මුදල් සහ මුදල් හා සමාන දෑ**

මුදල් හා මුදල් හා සමාන දෑ වලට ඇතුළත් වන්නේ අතැ'ති මුදල් සහ බැංකුවේ ඇති මුදල් හා ඒක්ෂණ තැන්පතු, බැංකුවේ ඇති ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් ය.

3. **බැරකම් හා ප්‍රතිපාදන**

3.1 **ජංගම බැරකම්**

ජංගම බැරකම් යනු ඉල්ලීම කිරීමේදී හෝ ශේෂ පත්‍ර දිනෙන් වසරක් ඇතුළත හෝ ගෙවිය යුතු බැරකම් ය. ශේෂ පත්‍ර දිනෙන් වසරකට හෝ ඊට වැඩි කාලයකට පසු ජංගම නොවන බැරකම් ගෙවිය යුතු වේ.

3.2 **බදු අයකිරීම**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 8(අ)(xii) වගන්තිය යටතේ ආයතනය ආදායම් බද්දෙන් නිදහස් වේ.

3.3 **විශ්‍රාම ප්‍රතිලාභ**

(i) *නිර්වචනය වූ ප්‍රතිලාභ සැලැස්ම*

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 16 ප්‍රකාරව සියලුම සේවකයන්ට සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන සලකනු ලැබ ඇත. කෙසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීම් යටතේ සේවකයකුට බැරකම් ඇති වන්නේ වසර පහක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසු පමණි.

(ii) *නිර්වචනය වූ දායක සැලැස්ම*

සමාගමේ සියලුම සේවකයන් සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාර අරමුදලේ සාමාජිකයන් වන අතර ඒ සඳහා එක් එක් සේවකයාගේ ඒකාබද්ධ වැටුපෙන් පිළිවෙලින් 12%ක් සහ 3%ක් බැගින් එකී අරමුදල්වලට සේව්‍යයා දායක වෙති.

4. **ආදායම් හා වියදම්**

(අ) ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්ගෙන් ලැබෙන ආදායම් සහ අනෙකුත් ආදායම් උපචිත පදනමක් මත ගණන් ගනු ලැබේ.

(ආ) කාර්යක්ෂම ආකාරයකින් අඛණ්ඩව මෙහෙයුම් කිරීමේ දී හා ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී දරනු ලබන සියලු වියදම්, වියදමට වැඩි ආදායම් අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් හා වියදම් ගිණුමෙන් අඩුකර තිබේ.

(ඇ) පොප්කෝන් අලෙවිය, ගොඩනැගිලි රැකවල් සේවය, බ. ජා. අ. ම. යේ ආදායම සහ ඒජන්සි තැපැල් කාර්යාල කටයුතුවලින් ලැබුණු ලාභ/(පාඩු) වර්ෂයේ මුදල් පදනම සඳහා ආදායම් හා වියදම් ගිණුමට ගනු ලැබේ.

5. **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ "වක්‍ර ක්‍රමය" භාවිත කරමිනි.

6. **බ. ජා. අ. ම. ආදායම**

| | | *2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු. ශ.* | *2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු. ශ.* |
|---|---|---|---|
| භාෂා පාඨමාලා ගාස්තු | | 4,437,000 | 3,433,500 |
| ජාත්‍යන්තර සම්බන්ධතා පාඨමාලා ගාස්තු | | 9,567,284 | 8,128,189 |
| ගැටුම් නිරාකරණය පාඨමාලා ගාස්තු | | 30,000 | 1,321,400 |
| වෙනත් ආදායම් | (සටහන 6.1) | 4,878,388 | 7,355,829 |
| | | 18,912,672 | 20,238,918 |
| 6.1 **වෙනත් ආදායම් (බ. ජා. අ. ම.)** | | | |
| පොලී ආදායම | | 4,573,258 | 6,557,098 |
| ශ්‍රවණාගාර කුලී ආදායම | | - | 688,803 |
| විනිමය ලාභ/(පාඩු) | | (56,972) | (26,117) |
| වෙනත් ආදායම් | | 12,750 | 36,110 |
| පුස්තකාල දෙපාර්තමේන්තුව | | 125,497 | 99,935 |
| සම්මන්ත්‍රණ ආදායම | | 127,126 | - |
| පාරිතෝෂික සඳහා අධිප්‍රතිපාදනය | | 96,729 | - |
| | | 4,878,388 | 7,355,829 |

7. **ආදායම - BMICH සත්කාරක සේවා සහ සත්කාරක සේවා අලෙවිහල**

| | | |
|---|---|---|
| නිවහන් ආදායම | 26,878,432 | 6,492,778 |
| ආහාර අලෙවිය, අලෙවිහල | 33,932,518 | 31,753,573 |
| ආපනශාලාව | 40,582,055 | 32,155,970 |

| | *2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු. ශ.* | *2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු. ශ.* |
|---|---|---|
| පාන වර්ග අලෙවිය | 657,454 | 322,358 |
| ගෘහභාණ්ඩ කුලී ආදායම | 262,500 | 5,995,344 |
| වෙනත් ආදායම් | 2,525,553 | 2,353,990 |
| | 104,838,512 | 79,074,013 |
| 8. පොදු කළමනාකරණ වියදම් | | |
| පොදු පරිපාලනය | 84,726,307 | 96,844,487 |
| මුදල් පරිපාලනය | 46,757,645 | 43,937,395 |
| ගබඩා පරිපාලනය | 673,283 | 106,312 |
| | 132,157,235 | 140,888,194 |
| 9. පොදු අලුත්වැඩියාවන් සහ නඩත්තුව | | |
| සිවිල් ඉංජිනේරු | 3,579,631 | 7,719,051 |
| විදුලි ඉංජිනේරු | 3,307,374 | 3,582,676 |
| ගෘහ පාලනය | 2,420,792 | 4,879,766 |
| උද්‍යාන | 3,671,435 | 4,847,402 |
| | 12,979,232 | 21,028,893 |
| 10. කාර්ය මණ්ඩල පරිපාලන වියදම් | | |
| පොදු පරිපාලනය - කාර්ය මණ්ඩල සේවා | 34,503,600 | 34,565,036 |
| මුදල් පරිපාලනය | 7,554,949 | 7,360,817 |
| ගබඩා පරිපාලනය | 3,478,804 | 3,168,204 |
| ආරක්ෂාව | 717,720 | 1,238,520 |
| සිවිල් ඉංජිනේරු | 17,104,821 | 15,984,699 |
| විදුලි ඉංජිනේරු | 15,144,596 | 16,882,122 |
| ගෘහ පාලනය | 16,503,485 | 17,309,095 |
| උද්‍යාන | 8,852,558 | 8,474,935 |
| | 103,860,533 | 104,983,428 |
| 11. ක්ෂයවීම | | |
| යන්ත්‍ර හා උපකරණ | 2,321,870 | 2,542,099 |
| රථ වාහන | 2,595,297 | 2,916,113 |
| කාර්යාල උපකරණ | 777,508 | 739,812 |
| වෙනත් උපකරණ | 611,726 | 632,629 |
| ගිනි අන්තරාය පද්ධතිය | 84,326 | 96,373 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම | 1,335,492 | 1,249,395 |
| බුමුතුරුණු හා තිරරෙදි | 1,673,738 | 1,696,095 |
| පිඟන් භාණ්ඩ හා හැඳි ගෑරුප්පු ආදිය | 1,596 | 1,823 |
| සමුළු පද්ධතිය | 502,018 | 573,735 |
| උද්‍යාන උපකරණ | 121,951 | 111,738 |
| විවිධ වත්කම් - උපකරණ | 223,890 | 255,186 |
| විදුලි උපකරණ | 1,819,082 | 1,588,856 |
| රූපවාහිනී උපකරණ | 20,958 | 23,952 |
| විදුලි | 11,027 | 10,258 |
| ගිණුම් පැකේජය | 189,314 | 151,873 |
| ටියුබ් | 682,068 | 510,846 |
| බහලුම් | 164,054 | 70,211 |
| | 13,135,905 | 13,170,994 |

| | *2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු. ශ.* | *2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු. ශ.* |
|---|---|---|
| 12. බ. ජා. අ. ම. වියදම් | | |
| සංක්‍රමණ ප්‍රවණතා සහ අභියෝග | 10,600 | - |
| අන්තර්ජාතික සම්බන්ධතා | 3,553,164 | 2,554,513 |
| භාෂා | 2,974,523 | 2,166,223 |
| ගැටුම් නිරාකරණය | 28,035 | 508,825 |
| ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුව | - | 737,411 |
| පුස්තකාල දෙපාර්තමේන්තුව | 558,193 | 957,000 |
| පොදු නඩත්තුව | 132,336 | 454,373 |
| පොදු වියදම් | 12,599,051 | 10,874,516 |
| පොදු උපයෝගිතා වියදම් | 522,901 | 564,168 |
| | 20,378,803 | 18,817,029 |
| ක්ෂයවීම් කාර්යාල උපකරණ | 375,865 | 311,733 |
| පුස්තකාල පොත් | 49,344 | 107,574 |
| පරිගණක සහ ශ්‍රව්‍ය උපකරණ | 151,807 | 196,693 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 63,588 | 153,140 |
| රථ වාහන | 34,089 | 58,141 |
| වායු සමීකරණ යන්ත්‍ර | - | 19,274 |
| වෙනත් උපකරණ | 78,261 | 112,666 |
| | 752,954 | 959,221 |
| | 21,131,757 | 19,776,250 |
| 13. BMICH සත්කාරක සේවා සහ BMICH සත්කාරක සේවා අලෙවි සැල | | |
| අලෙවි පිරිවැය | 44,482,333 | 33,150,864 |
| බෙදාහැරීමේ පිරිවැය | 4,224,080 | 2,786,512 |
| පරිපාලන වියදම් | 93,293,378 | 64,027,202 |
| මුල්‍ය පරිවැය | 80,674 | 73,874 |
| | 142,080,465 | 100,038,452 |
| 14. දේපළ, යන්ත්‍ර හා උපකරණ | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | 879,136,826 | 781,233,709 |
| බ. ජා. අ. ම. | 1,699,297 | 2,170,241 |
| BMICH සත්කාරක සේවා | 36,830,797 | 39,294,025 |
| BMICH සත්කාරක සේවා අලෙවි සැල | 629,629 | 267,189 |
| | 918,296,549 | 822,965,164 |

14.1 එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම
දේපළ, යන්ත්‍ර සහ උපකරණ

| | *2010.01.01 දිනට ලියා අඩුකළ අගය රු. ශ.* | *වර්ෂය තුළ එකතුවීම් රු. ශ.* | *වර්ෂයේ ක්ෂයවීම් රු. ශ.* | *2010.12.31 දිනට ලියා අඩුකළ අගය රු. ශ.* |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 660,199,116 | 33,074,994 | - | 693,274,110 |
| තාවකාලික ගොඩනැගිල්ල | - | 63,444,672 | - | 63,444,672 |
| අංගණ හා උද්‍යාන | 646,384 | - | - | 646,384 |
| යන්ත්‍ර සහ උපකරණ | 17,794,695 | 2,155,451 | 2,321,870 | 17,628,276 |

| | *2010.01.01 දිනට ලියා අඩුකළ අගය* | *වර්ෂය තුළ එකතුවීම්* | *වර්ෂයේ ක්ෂයවීම්* | *2010.12.31 දිනට ලියා අඩුකළ අගය* |
|---|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| රථ වාහන | 20,412,793 | 1,705,000 | 2,595,297 | 19,522,496 |
| කාර්යාල උපකරණ | 6,121,330 | 237,805 | 777,508 | 5,581,627 |
| රූපවාහිනී උපකරණ | 167,667 | - | 20,958 | 146,709 |
| වෙනත් උපකරණ | 4,602,114 | 567,624 | 611,726 | 4,558,012 |
| ගිනි අන්තරාය පද්ධතිය | 674,609 | - | 84,326 | 590,283 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10,433,842 | 636,473 | 1,335,492 | 9,734,823 |
| බුමුතුරුණු සහ තිර රෙදි | 12,553,250 | 2,033,654 | 1,673,738 | 12,913,166 |
| පිඟන් භාණ්ඩ සහ හැඳි ගෑරුප්පු | 12,764 | - | 1,596 | 11,168 |
| සම්මන්ත්‍රණ පද්ධතිය | 4,016,146 | - | 502,018 | 3,514,128 |
| උද්‍යාන උපකරණ | 870,328 | 307,948 | 121,951 | 1,056,325 |
| විවිධ වත්කම් | 21,995,385 | - | - | 21,995,385 |
| ගොඩනැගිලි උපකරණ | 1,791,038 | - | 223,880 | 1,567,158 |
| විදුලි උපකරණ | 11,391,493 | 5,284,405 | 1,819,082 | 14,856,816 |
| සෝපානය | 88,217 | - | 11,027 | 77,190 |
| Sage Accpac ERP | - | - | - | - |
| ගිණුම් පැකේජය | 1,466,177 | 432,068 | 189,314 | 1,708,931 |
| TUBS | 5,456,547 | - | 682,068 | 4,774,479 |
| බහලුම | 539,814 | 1,158,928 | 164,054 | 1,534,688 |
| | 781,233,709 | 111,039,022 | 13,135,905 | 879,136,826 |

14.2 බ. ජා. අ. ම

| දේපළ, යන්ත්‍ර හා උපකරණ | *2010.01.01 දිනට* ලියා අඩු කළ අගය | *වර්ෂය තුළ* එකතුවීම් | *වර්ෂයේ* ක්ෂයවීම් | *2010.12.31 දිනට* ලියා අඩුකළ අගය |
|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | 1,191,579 | - | (375,865) | 815,714 |
| පුස්තකාල පොත් | 563,063 | 34,344 | (49,344) | 548,063 |
| පරිගණක සහ ශ්‍රව්‍ය උපකරණ | 131,091 | 69,666 | (151,807) | 48,950 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 169,414 | - | (63,588) | 105,826 |
| රථවාහන | 34,089 | - | (34,089) | - |
| වායු සමීකරණ යන්ත්‍ර | - | - | - | - |
| වෙනත් උපකරණ | 81,005 | 178,000 | (78,261) | 180,744 |
| | 2,170,241 | 282,010 | (752,954) | 1,699,297 |

14.3 *BMICH සත්කාරක සේවා*
*දේපළ, යන්ත්‍ර හා උපකරණ*

| | | | | |
|---|---|---|---|---|
| රථවාහන | 3,283,074 | - | (410,384) | 2,872,690 |
| කාර්යාල උපකරණ | 624,597 | 86,499 | (85,220) | 625,876 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 26,941,917 | 163,350 | (3,379,357) | 23,725,910 |
| පිඟන් භාණ්ඩ හා හැඳි ගෑරුප්පු | 3,092,655 | 529,432 | - | 3,622,087 |
| විදුලි උපකරණ | 3,060,855 | 326,399 | (398,838) | 2,988,416 |
| මුළුතැන්ගෙයි උපකරණ | 1,664,647 | 556,707 | (241,294) | 1,980,060 |
| ලිනන් | 333,822 | 389,661 | (54,729) | 668,754 |
| යන්ත්‍ර හා මෙවලම් | 292,458 | 100,325 | (45,779) | 347,004 |
| | 39,294,025 | 2,152,373 | (4,615,601) | 36,830,797 |

14.4 *BMICH සත්කාරක සේවා අලෙවිහල*
*දේපළ, යන්ත්‍ර හා උපකරණ*

| | | | | |
|---|---|---|---|---|
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 26,641 | - | (3,300) | 23,311 |
| පිඟන් භාණ්ඩ හා හැඳි ගෑරුප්පු | 24,550 | 25,660 | - | 50,210 |

| | *2010.01.01 දිනට ලියා අඩුකළ අගය* *රු. ශ.* | *වර්ෂය තුළ එකතුවීම්* *රු. ශ.* | *වර්ෂයේ ක්ෂයවීම්* *රු. ශ.* | *2010.12.31 දිනට ලියා අඩුකළ අගය* *රු. ශ.* |
|---|---|---|---|---|
| විදුලි උපකරණ | 154,917 | - | (19,365) | 135,552 |
| මුළුතැන්ගෙයි උපකරණ | 61,081 | 385,180 | (25,705) | 420,556 |
| | 267,189 | 410,840 | (48,400) | 629,629 |

| | *2010.12.31* *රු.* | *2009.12.31* *රු.* |
|---|---|---|
| 15. *කාර්ය මණ්ඩල ණය* | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | | |
| ආපදා ණය | 13,250,415 | 12,130,074 |
| 16. *කෙටිකාලීන ආයෝජන* | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී, බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | | |
| ලංකා බැංකුව - ස්ථාවර තැන්පතු | 212,000,067 | 211,979,782 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව - ස්ථාවර තැන්පතු | 3,196,031 | 2,731,110 |
| මහ බැංකුව - භාණ්ඩාගාර බිල්පත් | 18,926,740 | 17,364,106 |
| විවිධ ඇප තැන්පතු හා ආයෝජන | 110,738 | 110,738 |
| | 234,233,576 | 232,185,736 |
| *බ. ජා. අ. ම.* | | |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් කොම්පැනි PLC | 20,249,920 | 18,505,669 |
| ලංකා බැංකු භාණ්ඩාගාර බිල්පත් - 130479 | 19,274,793 | 17,624,554 |
| සම්පත් බැංකුව - ස්ථාවර තැන්පතු | 3,713,544 | 3,560,218 |
| | 43,238,257 | 39,690,441 |
| | 277,471,833 | 271,876,177 |
| 17. *සමුච්චිත අරමුදල* | | |
| එස්.ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | | |
| 2010 ජනවාරි මස 01 දිනට ශේෂය | 458,169,628 | 390,226,327 |
| පූර්ව වර්ෂ ගැලපීම් | (893,668) | (457,718) |
| වර්ෂය තුළ අතිරික්තය | 111,165,847 | 68,401,019 |
| 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය | 568,441,807 | 458,169,628 |
| *බ. ජා. අ. ම.* | | |
| 2010 ජනවාරි මස 1 වැනි දිනට ශේෂය | 14,887,888 | 14,425,219 |
| වර්ෂයේ අතිරික්තය | (2,219,086) | 462,669 |
| 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය | 12,668,802 | 14,887,888 |
| *BMICH සත්කාරක සේවා සහ BMICH සත්කාරක සේවා අලෙවි හල* | | |
| 2010 ජනවාරි මස 1 දිනට ශේෂය | (20,964,439) | - |
| වර්ෂයේ හිඟය | (37,241,952) | (20,964,439) |
| 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය | (58,206,391) | (20,964,439) |
| | 522,904,218 | 452,093,077 |
| 18. *පදනම් ප්‍රාග්ධන ආධාර අරමුදල* | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | | |
| ආරම්භයේ දී සහ අවසානයේ දී ශේෂය | 541,653,179 | 541,653,179 |

| | *2010.12.31* | *2009.12.31* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| 19. *විවිධ අරමුදල්* | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | | |
| වෙනත් අරමුදල් | 919,306 | 919,306 |
| ප්‍රදර්ශන මධ්‍යස්ථාන අරමුදල | 3,999,820 | 3,999,820 |
| | 4,919,126 | 4,919,126 |
| 20. *විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම* | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | | |
| 2010 ජනවාරි මස 01 වැනි දිනට ශේෂය | 25,863,000 | 23,824,920 |
| *එකතුකළා* : වර්ෂය සඳහා ප්‍රතිපාදනය | 6,025,315 | 3,138,745 |
| | 31,888,315 | 26,963,665 |
| *අඩුකළා* : වසර තුළ කරන ලද ගෙවීම් | (1,600,165) | (1,100,665) |
| 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය | 30,288,150 | 25,863,000 |
| *BMICH සත්කාරක සේවා සහ BMICH සත්කාරක සේවා අලෙවි සැල* | | |
| වර්ෂය අවසානය සඳහා ප්‍රතිපාදනය | | |
| 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය | 460,800 | 158,538 |
| *බ. ජා. අ. ම.* | | |
| වර්ෂයේ ප්‍රතිපාදන සහ 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය | 91,371 | - |
| | 30,840,321 | 26,021,538 |
| 21. *දිගුකාලීන බැරකම්* | | |
| එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම | | |
| *මූල්‍ය බදු යටතේ බැඳීම්* | | |
| (i) හැටන් නැෂනල් බැංකුව 3810/003/BR23 බැඳීම් සිදුකර ඇත්තේ මූල්‍ය බදු ගිවිසුම යටතේ බද්දට දී ඇති සහ 2008 දෙසැම්බර් මාසයේ සිට සමාන වාරික 48කින් ගෙවිය යුතු වන මිට්සුබිෂි ලාන්සර් මෝටර් රථය මගිනි. | | |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 4,215,261 | 5,650,962 |
| ගැලපීම | (583,279) | - |
| | 3,631,982 | 5,650,962 |
| *අඩුකළා* : වසර තුළ බදු කුලි ගෙවීම් | (1,281,876) | (1,435,701) |
| | 2,350,106 | 4,215,261 |
| *අඩුකළා* : අවලම්බිත පොලිය | (723,882) | (1,092,006) |
| | 1,626,224 | 2,513,255 |
| *අඩුකළා* : ජංගම බැරකම් යටතේ දැක්වෙන වසරක් තුළ කළ යුතු ගෙවීම් | (887,031) | (887,031) |
| | 739,193 | 1,626,224 |

| | 2010.12.31 රු. | 2009.12.31 රු. |
|---|---|---|
| (ii) හැටන් නැෂනල් බැංකුව 3810/0003/BR24 බැඳීම් සිදුකර ඇත්තේ මූල්‍ය බදු ගිවිසුම යටතේ බද්දට දී ඇති සහ 2008 දෙසැම්බර් මාසයේ සිට සමාන වාරික 48කින් ගෙවිය යුතු වන ඉසුසු අර්ධ බඳ සහිත ට්‍රක් රථය මගිනි. | | |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 2,923,524 | 3,955,356 |
| අඩුකළා : වසර තුළදී බදු කුලී ගෙවීම් | (1,031,832) | (1,031,832) |
| | 1,891,692 | 2,923,524 |
| අඩුකළා : අවලම්බිත පොලිය | (592,317) | (915,399) |
| | 1,299,375 | 2,008,125 |
| අඩුකළා : ජංගම බැරකම් යටතේ දැක්වෙන වසරක් තුළ කළ යුතු ගෙවීම් | (708,750) | (708,750) |
| | 590,625 | 1,299,375 |
| (iii) ලංකා බැංකුව 02/2008 බැඳීම් සිදුකර ඇත්තේ මූල්‍ය බදු ගිවිසුම යටතේ බද්දට දී ඇති සහ 2008 දෙසැම්බර් මාසයේ සිට සමාන මාසික වාරික 48කින් ගෙවිය යුතු වන මිට්සුබිෂි ලාන්සර් මෝටර් රථය මගිනි | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 4,615,310 | 6,197,702 |
| ලබාගත් බදු | (602,000) | - |
| | 4,013,310 | 6,197,702 |
| අඩුකළා : වසර තුළ බදු කුලී ගෙවීම් | (1,375,992) | (1,582,392) |
| | 2,637,318 | 4,615,310 |
| අඩුකළා : අවලම්බිත පොලිය | (918,308) | (1,999,425) |
| | 1,719,010 | 2,615,865 |
| අඩුකළා : ජංගම බැරකම් යටතේ දැක්වෙන වසරක් තුළ කළ යුතු ගෙවීම් | (896,875) | (896,875) |
| | 822,135 | 1,719,010 |
| ලංකා බැංකුව 01/2008 බැඳීම සිදුකර ඇත්තේ මූල්‍ය බදු ගිවිසුම යටතේ බද්දට දී ඇති සහ 2008 ජූලි මාසයේ සිට සමාන මාසික වාරික 48කින් ගෙවිය යුතු වන සිංගල් කැබ් පික්අප් රථය මගිනි. | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 1,287,330 | 1,802,262 |
| | (514,932) | (514,932) |
| | 772,398 | 1,287,330 |
| අඩුකළා : අවලම්බිත පොලිය | (252,289) | (420,482) |
| | 520,109 | 866,848 |
| අඩුකළා : ජංගම බැරකම් යටතේ දැක්වෙන වසරක් තුළ කළ යුතු ගෙවීම් | (346,739) | (346,739) |
| | 173,370 | 520,109 |

| | 31.12.2010 රු. | 31.12.2009 රු. |
|---|---|---|
| (v) ලංකා බැංකුව TAFE - 45DI ට්‍රැක්ටරය<br>බැඳීම සිදුකර ඇත්තේ මූල්‍ය බදු ගිවිසුම යටතේ බද්දට දී ඇති සහ 2010 ඔක්තෝබර් මාසයේ සිට සමාන මාසික වාරික 48කින් ගෙවිය යුතු වන TAFE - 45DI ට්‍රැක්ටරය මගිනි. | | |
| ලබාගත් බද්ද | 1,614,192 | - |
| අඩුකළා : වසර තුළ බදු කුලී ගෙවීම් | (67,258) | - |
| | 1,546,934 | - |
| අඩුකළා : අවලම්බිත පොලිය | (353,809) | - |
| | 1,193,125 | - |
| අඩුකළා : ජංගම බැරකම් යටතේ දැක්වෙන වසරක් තුළ කළ යුතු ගෙවීම් | (311,250) | - |
| | 881,875 | - |
| | 3,207,198 | 5,164,718 |
| 22. විලම්බිත ආදායම<br>බ. ජා. අ. ම. | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 3,368,328 | 1,317,426 |
| එකතු කළා : වසර තුළ දී ලද ප්‍රදානයන් | - | 4,987,003 |
| | 3,368,328 | 6,304,429 |
| අඩුකළා : වසර තුළ දී කරන ලද ක්‍රමක්ෂය/වියදම් | (667,336) | (2,936,101) |
| දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය | 2,700,992 | 3,368,328 |

ප්‍රදානයන් ලැබෙන්නේ නිර්වචනය කරන ලද ව්‍යාපෘතිවලට දරන ලද වියදම් පදනම් කරගෙන වසර තුළ දී ක්‍රමක්ෂය කරන ලද ව්‍යාපෘති සහ ආධාර දෙන්නන් විසින් නිර්වචනය කරන ලද විශේෂිත ව්‍යාපෘති සඳහා ය.

11- 848

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 21564.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "බිටි'න් ඇපල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2000.04.25" දින සංස්ථාපිත සමාගමක් වන "බිටි'න් ඇපල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියාවිරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "බිටි'න් ඇපල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ඔක්තෝම්බර් මස 25 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-746

පීවී 21657.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ටෙල් ට්‍රොනික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2005.03.23" දින සංස්ථාපිත සමාගමක් වන "ටෙල් ට්‍රොනික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ටෙල් ට්‍රොනික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ඔක්තෝබර් මස 25 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-745

---

එන්(පීවීඑස්) 44947.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සිටි කෝපරේට් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2006.02.09" දින සංස්ථාපිත සමාගමක් වන "සිටි කෝපරේට් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සිටි කෝපරේට් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ඔක්තෝබර් මස 25 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-744

---

පීවීඑස් 8761.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වැනි වගන්තිය යටතේ "මැක්ඩොනල්ඩ්'ස් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනත (145 අධිකාරය) විධිවිධාන යටතේ "1982.07.01" දින සංස්ථාපිත සමාගමක් වන "මැක්ඩොනල්ඩ්'ස් ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතු වන නිරත නොවන බව නැතහොත් ක්‍රියාවිරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "මැක්ඩොනල්ඩ්'ස් ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ඔක්තෝම්බර් මස 25 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-743

---
